# වාර්ෂික වාර්තාව
# 2012

## සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය



ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදුපහසුකම් අමාත්‍යාංශය

# වාර්ෂික වාර්තාව 2012


**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය**

1 වන මහල , ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල

සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත

කොළඹ 02

දු.ක : 2 447429/2 447432 ෆැක්ස් : 2 423606

ඊ මේල් : cmastaff@sltnet.lk

www.condominium.lk

# අධ්‍යක්ෂ මණ්ඩලය

නීතිඥ කපිල ගමගේ මහතා
*(2010.05.13 සිට)*
සභාපති
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

පී.යු.උපවංශ මහතා
සාමාන්‍යාධිකාරි / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

දමිත කුමාරසිංහ මහතා
අධ්‍යක්ෂ ජෙනරාල්
මහජන උපයෝගිතා කොමිෂන් සභාව

චාන්දනී විජයවර්ධන මහත්මිය
අධ්‍යක්ෂිකා
ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය ( භාණ්ඩාගාර නියෝජිත )

ඩී.සී.සිරිබද්දන මහතා
සහකාර අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

කේ.එල්.එල්.ප්‍රේමනාත් මහතා
සාමාන්‍යාධිකාරි ,
ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය

මේජර් ජෙනරාල් වසන්ත කුමාර මහතා
*( 2011.08.29 සිට 2011.10.20 දක්වා )*
බ්‍රිගේඩියර් මහින්ද මුදලිගේ මහතා (RWP / RSP)
*(2012 මැයි සිට )*
සාමාන්‍යාධිකාරි
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

භද්‍රානි ජයවර්ධන මහත්මිය
නාගරික කොමසාරිස්
කොළඹ මහ නගර සභාව

ශාන්තා පී ලියනගේ මහත්මිය
නාගරික කොමසාරිස් (වැ.බ)
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

කේ.බී.ආර්.ධම්මික නාමල් මුතුගල මහතා
නාගරික කොමසාරිස්
දෙහිවල – ගල්කිස්ස මහ නගර සභාව

එච්.ඩී.චන්දිමා ජානකී මහත්මිය
*(2012 ජනවාරි – අප්‍රේල් )*
එච්.එන්.එස්.අංගම්න මහත්මිය
*(2012 මැයි – ජුනි )*
ඒ.එල්.එස්.මල්වැන්න මහතා
*(02012 අගෝස්තු – දෙසැම්බර් )*
නාගරික කොමසාරිස්
මොරටුව මහ නගර සභාව

නිහාල් ප්‍රනාන්දු මහතා
අධ්‍යක්ෂ ජනරාල්



# දැක්ම

රටේ නිවාස අවශ්‍යතාවය සඳහා විසඳුමක් ලෙස සහාධිපත්‍ය ජනාවාස.

# මෙහෙවර

සහාධිපත්‍ය දේපලවල, පදිංචිකරුවන්ගේ ප්‍රතිලාභය හා සුභ සාධනයට ගැලපෙන පරිදි ඉදිකිරීම සහ එම දේපල ක්‍රමවත්ව පාලනය හා කළමනාකරණය කිරීම සඳහා කළමනාකරණ සංස්ථා පිහිටුවා එම දේපල නඩත්තු කරවීම යන කාර්යයන් නියාමනය කිරීම.

# ආයතනික තොරතුරු

## ආයතනය

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

## සංස්ථාපනය

2003 නොවැම්බර් 10
1973 අංක 10 දරණ පොදු පහසුකම් මණ්ඩල පනත
2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල (සංශෝධිත) පනත

## කාර්යාල ලිපිනය

1වන මහල , ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත
කොළඹ 02

## දුරකථන / ෆැක්ස්

2447429 / 2447432
ෆැක්ස් : 2423606

## ඊමේල්

cmastaff@sltnet.lk , it@condominium.lk

## වෙබ් අඩවිය

www.condominium.lk

# අන්තර්ගතය


## 1

## පාලන වාර්තාව

අධිකාරියේ අරමුණු
අධිකාරියේ බලතල
අධිකාරියේ සේවාවන්
සමස්ථ ක්‍රියාකාරිත්වය
කළමනාකරණ සංස්ථා පිහිටුවීම ලියාපදිංචිය හා සක්‍රිය කිරීම
කළමනාකරණ සංස්ථා පිහිටුවීම
සභාධිපත්‍ය දේපළ ආරවුල් විසඳීම
මහල් නිවාස ක්‍රමවල පොදු අංගෝපාංග අළුත්වැඩියා කිරීම
ලියාපදිංචි නොකරන ලද සභාධිපත්‍ය දේපළ
සභාධිපත්‍ය දේපළ පිළිබඳ දැනුවත් කිරීම්
නීති සංශෝධන කටයුතු
අධිකාරියේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු
සංයුක්ත සැලැස්ම 2012-2016 /
ක්‍රියාකාරී සැලැස්ම 2012
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා විගණන හා
කළමනාකරණ කමිටු රැස්වීම්
සේවක මණ්ඩල ප්‍රතිසංවිධානය
විගණන හා කළමනාකරණ කමිටු
වාර්තාව

## 2


## ගිණුම් හා මූල්‍ය වාර්තාව

මූල්‍ය ප්‍රකාශය
ඒකාබද්ධ මූල්‍ය වාර්තාව
ගිණුම් සඳහා සටහන්
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## 3

## විගණකාධිපති වාර්තාව

# ආයතනික සැලැස්ම
## සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය



# අධිකාරියේ අරමුණු

(අ) සහාධිපත්‍ය දේපළවල හෝ අර්ධ සහාධිපත්‍ය දේපළවල සහාධිපත්‍ය කොටස් , සහාධිපත්‍ය අංගෝපාංග සහ පොදු පහසුකම් පාලනය කිරීම ,කළමනාකරණය කිරීම නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම ;

(ආ) සහාධිපත්‍ය දේපළවල හෝ අර්ධ සහාධිපත්‍ය දේපළවල පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් නිසි ආකාරයට හොඳින් නඩත්තු කරන බවට සහතික වීම සහ ඒ දේපළ මනා තත්වයෙන් සහ සේවයට යොදවාගත හැකි අන්දමින් සහ නිසි ආකාරයෙන් නඩත්තු කිරීම සඳහා කලින් කල අළුත්වැඩියා කිරීම් කරන බවට සහතික වීම සහ ඒ ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකරණ සංස්ථාවට හෝ අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන් සහයවීම හෝ නැතහොත් ඒ ක්‍රියාවන් කියාත්මක කිරීම කළමනාකරණ සංස්ථාව හෝ අයිතිකරු හෝ අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් හෝ පැහැර හරින අවස්ථාවකදී ඒ ක්‍රියාවලට සෘජුවම මැදිහත්වීම ;

(ඇ) ගින්නෙන් , මහජන කැළඹීම්වලින් සහ කැරලි කෝලහලවලින් වන උපද්‍රව වලට එරෙහිව සහාධිපත්‍ය කොටස් සංයුක්ත වන සියළු ගොඩනැගිලි රක්ෂණය කිරීමට හෝ රක්ෂණය වලංගුව තබා ගන්නා ලෙස කළමනාකරණ සංස්ථාව විසින් හෝ අයිතිකරුවන් විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් එසේ කරන බවට සහතික වීම සහ ඒ සඳහා වූ වාරික හෝ වෙනත් ගාස්තු අවස්ථානෝචිත පරිදි කළමනාකරණ සංස්ථාවෙන් හෝ අයිතිකරුගෙන් ආපසු අයකර ගැනීම ;

(ඈ) සහාධිපත්‍ය දේපළෙහි ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරට හෝ අර්ධ සහාධිපත්‍ය දේපලෙහි ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරට පටහැනිව අදාළ අයිතිකරුවන් හෝ සහාධිපත්‍ය කොටස්වල පදිංචිකරුවන් හෝ වෙනත් තැනැත්තෙකු විසින් ඉදිකරන ලද හෝ සිදුකර ඇති සියළු අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම ;

(ඉ) සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ කළමනාකරණ සංස්ථාව නිසි ආකාරයෙන් ක්‍රියාකරන බවට වගබලා ගැනීම සහ ඒ කළමනාකරණ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම ;

(ඊ) සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපලේ සහාධිපත්‍ය කොටස්වල කළමනාකරණ සංස්ථාවට හෝ අයිතිකරුට හෝ අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට ජලය , කසල, කාණු , ජලාපවාහනය , ගෑස් විදුලිය , කුණු කසල බැහැර කිරීම , වායු සමීකරණය , දුරකථන , ගුවන්විදුලි සහ රෙඩ්පියුෂන් වැනි සේවා ලබා දීමේදී ඒ අයිතිකරුට , අයිතිකරුවන්ට , පදිංචිකරුවන්ට සහයවීම ;

(උ) සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා මාර්ග , ප්‍රවේශයන් , තණ පිට්ටනි , වතු , උද්‍යාන , ක්‍රීඩාංගන සහ වෙනත් එළිමහන් ස්ථාන පිහිටුවා නඩත්තු කිරීමට සහයවීම හෝ එවැනි පහසුකම් පිහිටුවීම  සහ නඩත්තු කිරීමට අපොහොසත් වන විට කළමනාකරණ සංස්ථාව එවැනි ක්‍රියාවන් සඳහා ඍජුව ම මැදිහත් වීම ;

(ඌ) සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා මාර්ග ප්‍රවේශයන් , තණ පිට්ටනි , වතු උද්‍යාන , ක්‍රීඩාංගන සහ වෙනත් එළිමහන් ස්ථාන පිහිටුවා නඩත්තු කිරීමට සහයවීම හෝ එවැනි පහසුකම් පිහිටුවීම සහ නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත පැවරීම ;

(එ) සහාධිපත්‍ය දේපළවල හෝ අර්ධ සහාධිපත්‍ය දේපළවල සහාධිපත්‍ය කොටස්වල කළමනාකරණ සංස්ථාවේ හෝ ඒවායේ අයිතිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ ඉල්ලීම පරිදි ඒ සහාධිපත්‍ය කොටස් නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීමේ සේවා සැපයුම ;

(ඒ) පලුදු දරන්නන්ගේ අයිතින් ආරක්ෂාවීම සහතිකවීම සඳහා ලියාපදිංචි තාවකාලික සහාධිපත්‍ය දේපල තැනීමේ ප්‍රගතිය නියාමනය කිරීම සහ ඒ අයිතීන් ආරක්ෂා කිරීමට අවශ්‍ය කවර හෝ අවස්ථාවකදී ඊට මැදිහත්වීම ;

(ඔ) රජය විසින් අනුමත කිරීම සඳහා ප්‍රාග්ධන ආයෝජන සැලසුම් ඇතුළු සහාධිපත්‍ය දේපළ නැවත සංවර්ධනය කිරීම් වැඩසටහන් සකස් කිරීම සහ අනුමැතිය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ඕ) රජය විසින් අනුමත කරනු ලබන වැඩ සටහන්වලින් සහාධිපත්‍ය දේපළ නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා භාරගැනීමට හෝ ඒ ව්‍යාපෘති ක්‍රියාවේ යෙදවීමට භාර ගැනීම සඳහා ජාතික නිවාස   සංවර්ධන අධිකාරියෙන් හෝ නිවාස සංවර්ධන අධිකාරියකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ රජයේ යම් නියෝජිත ආයතනයකින් හෝ පෞද්ගලික සංවර්ධනකරුවෙකුගෙන් ඉල්ලා සිටීම ;

(ක) යම් ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරක හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරක දැක්වෙන යම් සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් අයිතිකරු විසින් අවසන් කිරීම පැහැර හැරීමේදී එය අවසන් කිරීමට භාර ගැනීම සහ

(ග) අධිකාරියේ අරමුණුවලින් යම් අරමුණක් ඉටුකර ගැනීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීම හො නැවත සංවර්ධනය කිරීම ;

(ච) ඉහත සඳහන් අරමුණු සියල්ලම හෝ ඉන් යම් අරමුණක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය  වන හෝ අහිතකර වන වෙනත් සියළු දේ කිරීම

# අධිකාරියේ බලතල

(අ) අත්කර ගැනීම , අධිග්‍රහණය , සතු කිරීම , ප්‍රදානය කිරීම හෝ මිල දී ගැනීම මගින් යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීම නැතහොත් එවැනි දේපළක් ත්‍යාගයක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීම හෝ එවැනි දේපළක් දැරීම , කළමනාක-රණය කිරීම ,විකිණීම , භාරදීම , හුවමාරු කිරීම ණී බද්දට දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) දේශීය හෝ විදේශීය යම් ප්‍රභවයකින් ත්‍යාග සහ පරිත්‍යාග ලබා ගැනීම ;

(ඇ) කර්තව්‍ය ඉටුකිරීමේදී අධිකාරියට අවශ්‍ය වන මුදල් ණයට ගැනීම ;

(ඈ) අධිකාරිය විසින් කුලියට දී ඇති යම් ඉඩම් කොටසක් හෝ ගොඩනැගිලි හෝ සහාධිපත්‍ය දේපළ සඳහා කුලිය අයකිරීම ;

(ඉ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරිය විසින් ඉටුක-රනු ලබන යම් සේවා සඳහා ගාස්තු හෝ අයකිරීම් අයකිරීම ;

(ඊ) සහාධිපත්‍ය කොටස්වලට අයිතිකරු වන්ට ඇති සම්බන්ධතාවට සමානුපාතිකව ඔවුන්ගෙන් වාරික මුදල් අයකර ගැනීම ;

(උ) සහාධිපත්‍ය දේපළ කොටස්වල පොදු පහසුකම්වලට හෝ පොදු අංගෝපාංග වලට අයිතිකරු ඇතුළු යම් තැනැත්තෙකු විසින් සිදුකරන ලද යම් හානියක් යථා තත්වයට ගෙන ඒද්‍යමහි ලා දරන ලද වියදම් අයිති කරුවන්ගෙන් හෝ ඒ තැනැත්තාගෙන් අයකර ගැනීම ;

(ඌ) යම් සහාධිපත්‍ය දේපළ කොටසක කළම නාකරණ සංස්ථාවේ හෝ එහි අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ ඉල්ලීම පිට ඒ දේපළ කොටස පිළිසකර කිරීම , අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම ඇතුළු සේවා ඒ සහ-ාධිපත්‍ය දේපළ කොටසට සැපයීම සහ ඒ සඳහා ගාස්තු අයකර ගැනීම ;

(එ) ඉදිකිරීම් කටයුතු භාරගැනීම ;

(ඒ) වෙනත් සහාධිපත්‍ය දේපළ කොටස් හෝ පොදු අංගෝපාංගවලටද සේවා සපයන නළ , රැහැන්, කේබල් සහ ප්‍රණාල පරීක්ෂා කිරීම , අළුත්වැඩියා කිරීම හෝ අළුත්කිරීමේ කාර්ය සඳහා හෝ සහාධිපත්‍ය දේපළේ නැතහොත් අර්ධ සහාධිපත්‍ය දේපළේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ හෝ කඩා බිඳ දැමීමේ කාර්යය සඳහා නැතහොත් මේ වගන්තියේ සඳහන් බලතල අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීමේදී අදාළ යම් ව්‍යවස්ථාපිත නියමයන්ට අනුකූලව ක්‍රියාකරන බවට සහතික වීමේ කාර්ය සඳහා අධිකාරිය විසින්ම හෝ එහි නිසි බලය පවරන ලද නියෝජිතයින් විසින් සියළු සාධාරණ වේලාවන්හිදී යම් සහාධිපත්‍ය දේපළකට ඇතුළුවීම ;

(ඔ) ලියාපදිංචි තාවකාලික සහාධිපත්‍ය පිඹුරෙහි දක්වා ඇති ගොඩනැගිලි ඉදිකිරීම පරීක්ෂා කිරීමේ සහ එහි ප්‍රගතිය සමාලෝචනය කිරීමේ කාර්යය සඳහා තාවකාලික සහාධිපත්‍ය දේපළෙහි යම් කොටසකට සියළු සාධාරණ අවස්ථාවන්හිදී අධිකාරිය හෝ නිසි පරිදි බලය පවරන ලද නියෝජිතයින් ඇතුළුවීම ;



(ඕ) අධිකාරියේ අරමුණු වලින් යම් අරමුණක් ඉටු කිරීමේ කාර්ය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි ගිවිසුම් වලට ඇතුළුවීම සහ වැඩ පිළිවෙලවල් සකස් කිරීම ;



(ක) සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ හෝ ලියා-පදිංචි තාවකාලික සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය කොට-ස්වල කළමනාකරණ සංස්ථාව සහ එහි අයිතිකරු හෝ පදිංචිකරු අතර හෝ අයිතිකරු සහ මිලදීගත් තැනැත්තා අතර හෝ අයිතිකරු සහ උගස්කරු අතර හෝ උකස්කරු සහ මිලදී ගැනීමට අදහස් කරන තැනැත්තා අතර හෝ උකස්කරු සහ උකස්ලාභියා අතර හෝ ඇතිවන ආරවුල් විසඳීම ;



(ග) අධිකාරියේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි නිළධාරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කරවීම සහ එහි නිලධරයන් සහ සේවකයින් පිළිබඳ විනය පාලනය ක්‍රියාත්මක කරවීම ;

(ච) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සඳහා රීති සෑදීම ;

සහ

(ජ) අධිකාරියේ අරමුණු නිසි සෙල ඉටුකර ගැනීමට හැකිවන පරිදි අධිකාරියේ මතය අනුව අවශ්‍ය විය හැකි සියළුම දේ ඉටුකිරීම

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

# පාලන වාර්තාව

# 2012

**2012 වර්ෂයේ අධිකාරියේ සමස්ථ ක්‍රියාකාරිත්වය**

සභාධිපත්‍ය දේපල නියාමනය සඳහා 2003 අංක 24 දරන පනතින් සංශෝධිත 1973 අංක 10 දරන සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරී පනතින් ලබා දී ඇති නියාමන බලතල උපයෝගී කර ගනිමින් 2012 වර්ෂයේ ක්ෂේත්‍රයට හා සේවාදායකයින් වෙත කාර්යක්ෂම සේවාවක් සැපයීමට අධිකාරියට හැකිවිය. 1982 අංක 45 සහ 2003 අංක 39 යන පනත් වලින් සංශෝධිත 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ ප්‍රතිපාදන අනුව නියාමන කටයුතු කරමින් මෙම සේවාවන් සැපයීමට උපරිම උත්සහායක් ගන්නා ලදි .

# 2012 වර්ෂයේ අධිකාරියේ සමස්ථ ක්‍රියාකාරීත්වය

## සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ප්‍රධානතම කාර්යයන්

01.සහාධිපත්‍ය දේපල වල පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් පිළිබඳ සහතික නිකුත් කිරීම

02.අයිතිය පවරන ලද සහාධිපත්‍ය දේපල වල කළමනාකරණ සංස්ථා පිහිටුවීම

03.සහාධිපත්‍ය දේපල පාර්ශවකරුවන් අතර ඇතිවන ආරවුල් විසඳීම

04.පදිංචියට නුසුදුසු තත්වයේ ඇති නිවාස ක්‍රම සඳහා නැවත සංවර්ධනය කිරීමේ සැළසුම් සකස් කිරීම

05.2012 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වෙන් කරන ලද මහල් නිවාස වල විශාල පරිමාණයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම හා කළමනාකරණ සංස්ථාවලට ඉදිරි නඩත්තු වගකීම් පැවරීම

06.මෙතෙක් අයිතිය පැවරීමට නොහැකිව ඇති රාජ්‍ය අංශයේ හා පුද්ගලික අංශයේ දේපල නියාමනය කිරීම සඳහා අදාල ආයතන සමග කටයුතු කිරීම

07.සුනාමි ප්‍රතිසංස්කරණ යටතේ ඉදිකල සහාධිපත්‍ය නිවාස ක්‍රමවල අයිතිය බැහැර කිරීමේ කටයුතු සඳහා එම දේපල හඳුනාගැනීම

08.සහාධිපත්‍ය දේපල පදිංචිකරුවන් / කළමනාකරණ සංස්ථා දැනුවත් කිරීමේ වැඩ සටහන් මෙහෙයවීම

## සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම්

තාවකාලික අර්ධ සහ පූර්ණ සහාධිපත්‍ය දේපල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කිරීම සඳහා ඒවායේ පොදු අංගෝපාංග හා පොදු පහසුකම් පිළිබඳ සහතිකයක් ලබා දීම අධිකාරියේ ප්‍රධාන කාර්යයක් වන අතර අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගය ද වේ.

**සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම 2005-2012**

| | තාවකාලික සහාධිපත්‍ය සහතික | අර්ධ සහාධිපත්‍ය සහතික | පූර්ණ සහාධිපත්‍ය සහතික |
|---|---|---|---|
| 2005 | - | - | 12 |
| 2006 | - | 03 | 81 |
| 2007 | 11 | 02 | 92 |
| 2008 | 04 | 03 | 94 |
| 2009 | 05 | 02 | 112 |
| 2010 | 01 | 02 | 62 |
| 2011 | 06 | 06 | 50 |
| 2012 | 05 | 04 | 49 |

2011 වර්ෂයේ දී සහතික පත්‍ර 62 ක් නිකුත් කිරීමෙන්, අධිකාරිය ලත් ආදායම රු.මිලියන 27.7 ක් වූ අතර, 2012 වර්ෂයේදී සහතික 58 ක් නිකුත් කල අතර, ලබා ගත් ආදායම රු.මිලියන 21.53 දක්වා පහත වැටුණි,

මෙම ආදායම පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ සහාධිපත්‍ය සහතික සඳහා ඉදිරිපත් වූ අයදුම් පත්‍ර වලින් 36 ක්ම ඒකක 10 ට අඩු සහාධිපත්‍ය දේපළ වීමයි එමෙන්ම සහාධිපත්‍ය සහතිකය ලබා ගෙන ඉඩම් ලියාපදිංචි කළ යුතු දේපල විශාල සංඛ්‍යාවකට පළාත් පාලන ආයතන වලින් අනුකූලතා සහතික ලබා ගැනීමට නොහැකි තත්වයක තිබීමද අධිකාරියේ ආදායම පහත වැටීමට හේතු විය. එමෙන්ම ඉදිකිරීමට යෝජිත විශාල පරිමාණයේ දේපල විශාල සංඛ්‍යාවක් ඇතත්, ඒවා 2012 වර්ෂයේ අවසානයේදී ද සැළසුම් සකස් කරමින් පවතී.

## කළමනාකරණ සංස්ථා පිහිටුවීම, ලියාපදිංචිය හා සක්‍රීයව පවත්වාගෙන යාමට මැදිහත්වීම්

2012 වර්ෂයේදී අධිකාරිය විසින් කළමනාකරණ සංස්ථා සහ කළමනාකරණ කමිටු 219 ක් පිහිටුවීමට කටයුතු කරන ලදි. ඒ අනුව 2012 දෙසැම්බර් 31 වන දිනට මුලු දිවයිනේම අධිකාරියේ මැදිහත් වීමෙන් පිහිටුවන ලද මුලු කළමනාකරණ සංස්ථා ගණන 707 ක් වේ. 2012 වර්ෂයේ දී පිහිටුවන ලද කළමනාකරණ සංස්ථා වලින් 183 ක් රාජ්‍ය අංශය ඉදිකල සහාධිපත්‍ය දේපල වල පිහිටුවා ඇති අතර 37 ක් පුද්ගලික අංශය ඉදිකර අයිතිය බැහැර කරන ලද දේපල වල පිහිටුවන ලද කළමනාකරණ සංස්ථා වේ. එමෙන්ම අනුකූලතා සහතික ලබා ගැනීමට නොහැකි වීම නිසා හා ඉඩම් ගැටළු නිරවුල් නොවීම නිසා සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමට නොහැකි සහ කළමනාකරණ සංස්ථා පිහිටුවීමට නොහැකි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඉදිකරන ලද නිවාස ක්‍රම වල පදිංචිකරුවන්ට අනාගත කළමනාකරණ සංස්ථාවක කාර්යය පුරුදු වීමට හැකිවන ලෙස කළමනාකරණ කමිටු 38 ක් පිහිටුවීමට කටයුතු කරන ලදි. 2011 වර්ෂයේ අයවැය ලේඛනයෙන් මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව රජය ඉදිකල මහල් නිවාස වල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග අලුත්වැඩියාවන් වසර 03ක දී නිම කිරීම සඳහා රු. මිලියන 1000 ක් වෙන්කල අතර 2012 වර්ෂයේදී ද මෙම අලුත්වැඩියාවන් සඳහා මුදල් යෙදවූ බැවින් කළමනාකරණ සංස්ථා පිහිටුවීමේදී ඒවායේ පදිංචිකරුවන්ගෙන් වැඩි දායකත්වයක් ලබාගත හැකිවිය.

එසේ වුවද කළමනාකරණ සංස්ථා පිහිටුවීමේ දී 2012 වර්ෂයේදී ද පහත සඳහන් දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවිය.

01.දේපලේ පොදු අංගෝපාංග නඩත්තුව සඳහා කළමනාකරණ සංස්ථාවේ වැදගත්කම පිළිබඳ

දේපල අයිතිකරුවන්ට ඇති අනවබෝධය.

02.ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතන විසින් ඉදිකරන ලද මහල් නිවාස ක්‍රමවල පදිංචිකරුවන් තවමත් කළමනාකරණ සංස්ථා පිහිටුවීම සම්බන්ධයෙන් උනන්දුවක් නොදැක්වීම.

03.පෞද්ගලික ආයතන විසින් ඉදිකරනු ලබන බොහෝ දේපළ වල අයිතිකරුවන් ස්ථිර ලෙස ඒවායේ පදිංචි නොවීම.

04.මේවායේ පදිංචිකරුවන් කාර්යබහුල වීම නිසා ස්වේච්ඡා පදනමක් යටතේ නඩත්තුව හා කළමනාකරණ කටයුතු වලට සම්බන්ධ වීමට දක්වන මැළිකම.

05.නඩත්තු මුදල් ගෙවීම පැහැර හැරීම හා කළමනාකරණ සංස්ථාවේ නිළධාරී මණ්ඩලයට අනෙක් පදිංචිකරුවන් සහය නොදැක්වීම.

එසේ වුවද, අධිකාරියේ කාර්යය මණ්ඩලය සභාධිපත්‍ය දේපල වල අයිතිකරුවන්/පදිංචිකරුවන් දැනුවත් කරමින් වර්ෂය පුරාම සෑම සති අන්තයකම මේ සඳහා විශාල ප්‍රයත්නයක් දරන ලදි.

## කළමනාකරණ සංස්ථා පිහිටුවීම

| වර්ෂය | ඉලක්ක | ප්‍රගතිය |
|---|---|---|
| 2005 | 75 | 64 |
| 2006 | 195 | 24 |
| 2007 | 100 | 50 |
| 2008 | 120 | 63 |
| 2009 | 120 | 49 |
| 2010 | 120 | 54 |
| 2011 | 130 | 184 |
| 2012 | 250 | 219 |
| එකතුව | 1110 | 707 |

## සභාධිපත්‍ය දේපල වල ආරවුල් විසඳීම්

සභාධිපත්‍ය දේපලේ කළමනාකරණ සංස්ථා හා අයිතිකරු, අයිතිකරු හෝ පදිංචිකරු අතර, මුල් අයිතිකරු හෝ මිලදී ගත් තැනැත්තා අතර, ඇතිවන ආරවුල් විසඳීම සඳහා මැදිහත් ව කටයුතු කිරීමට අධිකාරියට බලතල ලබා දී ඇති ඒ අනුව දැනට එම ආරවුල් විසඳීම සඳහා පරීක්ෂණ සභාවක් පිහිටුවා ඇති එම පරීක්ෂණ සභාව වෙත 2012 වර්ෂයේදී ඉදිරිපත් වූ පැමිණිලි ස්වරූපය අනුව පහත දැක්වෙන ලෙස වර්ග කල හැක.

- ගොඩනැගිල්ල ඉදිකර , අලෙවි ගිවිසුමකින් විකුණා වසර 05 කට පමණ කාලයක් ගත වී ඇතත්, සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කළ නොහැකි නිසා පදිංචිකරුවන්ට ඔප්පු ලබා නොදීම.
- අනුමත කරන ලද ගොඩනැගිලි සැළසුමට පටහැනිව සමහර දේපල සංවර්ධකයින් මහල් කිහිපයක් අනුමත කරගෙන තවත් සමහර මහල් කිහිපයක් ඉදිකර විකිණීම නිසා අනුකූලතා සහතිකය ලබාගත නොහැකිවීම.
- පොදු අංගෝපාංග හා පොදු පහසුකම් අනුමත සැළැස්මට අනුකූලව ලබා නොදීම.
- පදිංචිකරුවන් කළමනාකරණ සංස්ථාවට මාසික නඩත්තු මුදල් නොගෙවීම.
- තම නිවස පරිහරණයේදී අන් අයට පීඩාවන් සිදුකරනු ලබන බවට ලද පැමිණිලි.
- අනවසර ඉදිකිරීම් සිදුකිරීම.

2012 වර්ෂයේ දී මෙවැනි පැමිණිලි 100 ක් අධිකාරිය වෙත ලැබිණි. පැමිණිලි 87 කට 2012 වර්ෂයේ දී අධිකාරිය විසඳුම් ලබා දී ඇති අතර, පැමිණිලි 13 ක් විභාග වෙමින් පවතී. ඉහත ක්‍රියාකාරීත්වයන් තුලින් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පසුගිය වසර තුලදී අධිකාරිය පිහිටුවීමට හේතු වූ පරමාර්ථ ඉටුකිරීම සඳහා මැනවින් දායකත්වය සපයා ඇති බව සඳහන් කල හැකිය. පැමිණිලි විභාග කිරීමේ නව ක්‍රමයක් හඳුන්වාදීම මගින් එම ක්‍රියාවලිය ඉක්මන් කිරීමට 2012 වර්ෂයේදී පියවර ගන්නා ලදි.

## මහල් නිවාස ක්‍රමවල පොදු අංගෝපාංග අලුත්වැඩියා කිරීම්

2011 අයවැය ලේඛනයෙන් සර්පන්ටයින් මහල් නිවාස ක්‍රමයේ පදිංචිකරුවන්ට කල නොහැකි අලුත්වැඩියාවන් සඳහා රු. මිලියන 25 ක මුදලක් වෙන් කරන ලදී . 2011 මැයි මස දී එහි ප්‍රතිසංස්තරණ කටයුතු ආරම්භ කරන ලද අතර, දෙසැම්බර් මස දී ප්‍රතිසංස්කරණ කටයුතු නිමකර පදිංචිකරුවන් වෙත භාර දෙන ලදී. 2012 වර්ෂයේදී ද මෙවැනි නිවාස ක්‍රම 07 ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු.මිලියන 109.2 ක් වෙන්කරන ලද අතර, වර්ෂය තුලදී භාණ්ඩාගාරයෙන් ලබාදෙන ලද ප්‍රතිපාදන අනුව රු මිලියන 55.5 ක වැඩ අවසන් කිරීමට කටයුතු කර ඇත. දෙහිවල ජාතික නිවාස ක්‍රමය හා කින්දවත්ත නිවාස ක්‍රමයේ වැඩ අවසන් කර කළමනාකරණ සංස්ථාවලට අනාගත නඩත්තු කටයුතු සඳහා පවරන ලදි. බෝලමේසවත්ත නිවාස ක්‍රමයේ අලුත්වැඩියා කටයුතු 2012 දෙසැම්බර් 31 දින වන විට අවසන් කරන ලද අතර, කළමනාකරණ සංස්ථාවට පැවරීම 2013 ජනවාරි මස දී සිදුකිරීමට නියමිතය. මේ අනුව 2012 වර්ෂයේ දී පහත සඳහන් නිවාස ක්‍රමවල ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලදී.

| නිවාස ක්‍රමය | ප්‍රතිලාභී පවුල් ගණන | 2012 දෙසැම්බර් 31 දිනට කරන ලද වැඩ වටිනාකම රු.මි |
|---|---|---|
| දෙහිවල නිවාස ක්‍රමය | 54 | 6.53 |
| කිත්දවත්ත නිවාස ක්‍රමය | 34 | 7.17 |
| බෝලමේසවත්ත නිවාස ක්‍රමය | 146 | 18.13 |
| කම්කරුපුර නිවාස ක්‍රමය | 240 | 8.82 |
| ඩයස්පෙදෙස නිවාස ක්‍රමය | 30 | 2.10 |
| අලුත්කඩේ නිවාස ක්‍රමය | 95 | 5.95 |
| දිසානායකවත්ත නිවාස ක්‍රමය | 72 | 7.43 |
| එකතුව | 671 | 56.13 |

## ලියාපදිංචි නොකරන ලද සහාධිපත්‍ය දේපල

පුද්ගලික අංශය ඉදිකල සමහර සහාධිපත්‍ය දේපල හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මුල් වකවානුවේ ඉදිකල දේපළ විශාල සංඛ්‍යාවක් මෙතෙක් ලියාපදංචි කර නොමැති බව අධිකාරිය විසින් හඳුනාගන්නා ලදී. ප්‍රමාණයෙන් 150 කට අධික මෙම දේපල වල මේ වන විට මිළදී ගත් පුද්ගලයින් පදංචි වී සිටියද අයිතිය පැවරීමේ කටයුතු සිදු නොවීම පිළිබඳ ගැටළුව අදාල ආයතන හා නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 වර්ෂයේ දී සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස අදාල ආයතන මෙම ගැටළුව විසඳීම සඳහා යොමු කරවීමට අධිකාරියට හැකිවිය.

## සහාධිපත්‍ය දේපල පිළිබඳ දැනුවත් කිරීම්

සහාධිපත්‍ය දේපල නීතිය පිළිබඳ එම දේපල වල පදිංචිකරුවන්ගේ දැනුම වර්ධනය කිරීම ආකල්ප වෙනස් කිරීම, කළමනාකරණ සංස්ථා සවිබල ගැන්වීම, සඳහා වර්ෂය පුරාම අධිකාරියේ නිලධාරීන් ක්‍රියාත්මක වැඩ සටහනකට සහභාගී විය.

ඒ අනුව,

- "සහාධිපත්‍ය" ත්‍රෛමාසික ප්‍රකාශනය එළිදැක්වීම හා බෙදාහැරීම 2012 වර්ෂයේදී සාර්ථකව ඉටුකරන ලද අතර, ප්‍රකාශන 03 ක් එළිදැක්වූ අතර පිටපත් සංඛ්‍යාව 45,000 ක් විය.
- කළමනාකරණ සංස්ථා නායකයින් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2012 ඔක්තොම්බර් මස ලෝක ජනාවාස දිනය පදනම් කරගෙන කොළඹ නගර සභා සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවති අතර එයට කළමනාකරණ සංස්ථා 500ක සමාජිකයින් සහභාගී විය.
- ලෝක ජනාවාස දිනය පදනම් කරගෙන කොළඹ සහ අවට නාගරික ප්‍රදේශ වල පාසැල් 08 ක ඉහළ ශ්‍රේණිවල ශිෂ්‍යයන් 8,000 ක් පමණ සහාධිපත්‍ය දේපල වල පදිංචිය හා නඩත්තුව පිළිබඳව දැනුවත් කරන ලදී.

## සුනාමි ප්‍රතිසංස්කරණ යටතේ ඉදිකල සහාධිපත්‍ය දේපල හඳුනාගැනීම්

2004 වර්ෂයේදී සුනාමි ප්‍රතිසංස්කරණ යටතේ නිවාස 19,838 ක් ඉදිකර තිබූ අතර, එයින් සහාධිපත්‍ය ද්විත්ව නිවාස ක්‍රම 30 ක් ඉදිකර ඇති අතර, නිවාස සංඛ්‍යාව 2,064 ක් විය. සහාධිපත්‍ය මහල් නිවාස ක්‍රම 39 ක් ඉදිකර ඇති අතර, නිවාස සංඛ්‍යාව 3,749 ක් බව අධිකාරිය විසින් 2012 වර්ෂයේ කරන ලද සමීක්ෂණයේදී හඳුනාගන්නා ලදි. මෙම නිවාස ක්‍රම කොළඹ, කළුතර, ගාල්ල, මාතර, ත්‍රිකුණාමලය,අම්පාර, මඩකලපුව හා ගම්පහ දිස්ත්‍රික්ක වල විසිර ඇති බව ද හඳුනාගන්නා ලදි. මෙම සහාධිපත්‍ය නිවාස 5,813 සඳහා අයිතිය ලබා දීම මෙතෙක් සිදුවී නොමැති බැවින්, ඒවායේ පොදු අංගෝපාංග නඩත්තුව පිළිබඳ වගකීම ගැටළු සහගත බව මෙම සමීක්ෂණයේ දී හඳුනා ගන්නා ලදි. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස 2013 වර්ෂයේ අයවැය යෝජනා වලදී අයිතිය ලබාදීමේ ප්‍රතිපත්තිය පිළිබඳව රජයේ අවධානය යොමු කිරීමට අධිකාරියට හැකියාව ලැබුණි.

## නීති සංශෝධන කටයුතු

1973 අංක 10 දරන සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරී පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල උපදෙස් මත පත්කරන ලද විද්වත් කමිටුව 2012 වර්ෂය තුලදී කමිටු රැස්වීම් පවත්වා අවසාන කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත යැවීමට කටයුතු කරන ලදි. 2012 වර්ෂය අවසාන වන විට එම කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය විසින් ව්‍යවස්ථා පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු

කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණි.

## වෙනත් ආදායම් ඉපයීම්

අධිකාරියේ ආදායම් අඩුවීමේ ප්‍රවනතාවය පිළිබඳ නිරන්තරයෙන් සැළකිලිමත් වූ අධිකාරිය පහත සඳහන් කාර්යයන් සඳහා ද යොමු වෙමින් විකල්ප ආදායම් ඉපයීමේ කටයුතු කරන ලදි.

1 ගම්පහ, මීගමුව, ජාතික රෝහල් වල මළ පිරිපහදු යන්ත්‍රාගාර නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු.

2 මාදිවෙල මන්ත්‍රී නිල නිවාස සංකීර්ණයේ නඩත්තු කටයුතු.

3 ඇලපිටිවල මහල් නිවාස ක්‍රමයේ පොම්පාගාර නඩත්තු කටයුතු හා

4 පළාත් පාලන දෙපාර්තමේන්තුව අනුමත කරන ලද විමධ්‍යගත අරමුදල් ව්‍යාපෘති වල කොන්ත්‍රාත් කටයුතු

මෙම විකල්ප ප්‍රභවයන්ගේ 2012 වර්ෂයේ දී රු.මිලියන 8.0 ක අදායමක් අධිකාරිය විසින් උපයාගෙන තිබුණි.

## අධිකාරියේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු

2012 වර්ෂයේ දී අධිකාරියේ සේවක වැටුප් ගෙවීම සඳහා රු. මිලියන 39.5 ක ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් ලබාදෙන ලදි. අධිකාරියේ මෙහෙයුම් කටයුතු වලින් රුපියල් මිලියන 41.5 පිරිවැටුමක් ලබා ගැනීමට අධිකාරියට හැකිවිය. 2011 වර්ෂයේ සමස්ථ පිරිවැටුම රු. මිලියන 44.7 හා සැසඳීමේ දී මෙ 7.1% ක පහත වැටීමකි. 2011 අධිකාරියේ සමස්ථ වියදම රු.මිලියන 63.6 ක් වූ අතර, 2012 දී එය රු,මිලියන 71.6 ක් විය. වැටුප් ගෙවීම සඳහා ඉහත පරිදි භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම නිසා අවසානයේ දී රු.මිලියන 8.96 ක මෙහෙයුම් අතිරික්තයක් ලබාගැනීමට අධිකාරියට හැකිවිය. ප්‍රාග්ධන ලාභ ද සමග සළකා බැලීමේදී රු.මිලියන 16.0 ක ආදායම් අතිරික්තයක් ඉපයීමට 2012 වර්ෂයේදී අධිකාරියට හැකි වී ඇත.

## සංයුක්ත සැළසුම - 2012-2016

## ක්‍රියාකාරී සැළැස්ම - 2012

අධිකාරිය විසින් 2012-2016 වර්ෂය සඳහා සංයුක්ත සැළැස්ම සකස් කරන ලද අතර, එය පදනම් කර ගනිමින් 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැළසුම සකස් කරන ලදී එම සැළසුම් ඉලක්ක පදනම් කර ගනිමින් 2012 අධිකාරියේ සමස්ථ මෙහෙයුම් කටයුතු සිදු කල බව මෙහිදී සඳහන් කල යුතුය.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

2012 වර්ෂයේ දී අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07 ක් පවත්වන ලද අතර, ක්ෂේත්‍රය සම්බන්ධ වැදගත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා රාශියක් සඳහා තීරණ ගන්නා ලදි. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 07 හා විශේෂ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පවත්වන ලදි.

## සේවක මණ්ඩල ප්‍රතිසංවිධානය

2010 වර්ෂයේ දී අධිකාරියේ කාර්ය මණ්ඩල ඇස්තමේන්තු හා උසස්වීම් හා බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලදි. ඒ අනුව 2011 වර්ෂයේ දී සේවක ඇස්තමේන්තුවේ ඇබෑර්තු අනුව උසස්වීම් ලබා දීමට පියවර ගන්නා ලදි. එමෙන්ම අත්‍යාවශ්‍ය තනතුරු සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට පියවර ගන්නා ලදි. 2011 අවසානය වනවිට කාර්ය මණ්ඩලය 110 ක් වූ අතර, 2012 දෙසැම්බර් වනවිට එම තත්වය නෙවෙනස්ව පවතින අතර පවතින පුරප්පාඩු 2013 වර්ෂයේ දී පියවීම සඳහා කටයුතු කරනු ලබයි.

අධිකාරියේ 2012 වර්ෂයේ කාර්ය සාධනයට දායක වූ කාර්ය මණ්ඩලයේ සියලුම සේවකයින්ටත්, අධිකාරියේ කටයුතු වලදී සහය දැක්වූ සියලුම අමාත්‍යාංශ,දෙපා-ර්තමේන්තු, රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල ප්‍රධානීන්ටත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ටත්, ස්තූතිය පළකිරීමට මෙය අවස්ථාවක් කරගනිමි. තවද අධිකාරියේ ගමන් මග තිරසාර ලෙස සකස් කර ගැනීමට උපදෙස් දෙමින් අප ධෛර්යමත් කළ ගරු ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමන්ට, අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පළකර සිටිමි. තවද, අමාත්‍යාංශ ලේකම්, අතිරේක ලේකම්වරු ඇතුලු කාර්ය මණ්ඩලයටත් අධිකාරියේ කටයුතු වලදී දක්වන සහයෝගය පිළිබඳව ස්තූතිය පළකර සිටිමි.

සභාපති

2013/02/28

# විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

රාජ්‍ය ව්‍යාපාරයන්හි යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 වගන්තියේ උපදෙස් පරිදි වාර්ෂික වාර්තාව සමග ඉදිරිපත් කළයුතු 2012 වර්ෂයේ දී පැවති විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචන වාර්තාව.

රාජ්‍ය ව්‍යාපාරයන්හි යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 වගන්තියේ උපදෙස් පරිදි වාර්ෂික වාර්තාව සමග විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචන වාර්තාවක් ඉදිරිපත් කළ යුතුව ඇති සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2012 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව.

2012 විගණන කමිටුව පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විතය.

2012 විගණන කමිටුව පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විතය.

| සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව |
|---|
| චාන්දනි විජයවර්ධන මහත්මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂිකා<br>රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපර්තමේන්තුව<br>(භාණ්ඩාගාර නියෝජිත)මහා භාණ්ඩාගාරය |
| **සාමාජික** |
| කේ.බී.වී.ධම්මික නාමල් මුතුගල මහතා<br>(2011 අගෝස්තු සිට )<br>නාගරික කොමසාරිස්<br>දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව |
| බ්‍රිගේඩියර් ඒ.එල්.එස්.එම්.පෙරේරා මහතා<br>( 2012 ජනවාරි සිට 2012 ජූලි දක්වා)<br>සාමාන්‍යාධිකාරී<br>ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| බ්‍රිගේඩියර් මහින්ද මුදලිගේ මහතා<br>( 2012 ජූලි සිට 2012 දෙසැම්බර් දක්වා)<br>සාමාන්‍යාධිකාරී<br>ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| **නිරීක්ෂක** |
| අයි.කේ.කේ.එස්.එදිරිසිංහ මහතා<br>විගණන අධිකාරී<br>නියෝජ්‍ය විගණකාධිපති නියෝජිත<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| **විකල්ප සමාජික** |
| ශාන්තා පීලියනගේ මහත්මිය<br>ශ්‍රී ජයවර්ධනපුර , කෝට්ටේ මහ නගර සභාව |
| අධිකාරියේ ආරාධිත නිලධාරින් ලෙස පහත සඳහන් නිලධාරීන් සහභාගී විය. |

| |
|---|
| නිතීඥ කපිල ගමගේ මහතා<br>සභාපති |
| ජී.යූ.උපවංශ මහතා<br>සාමාන්‍යාධිකාරී/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් |
| කේ.එච්.ඒ.උපාලි මහතා<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) |
| චමිලා නිලූෂි පෙම්මාඩු මෙනවිය<br>අභ්‍යන්තර විගණක |

2012 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 09ක් පවත්වන ලදී.

පහත සඳහන් ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටුව විමර්ශණය කරන ලදී.

1973 අංක 10 දරණ (සංශෝධිත) සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරී පනත සහාධිපත්‍ය ක්ෂේත්‍රයේ පවතින වර්තමාන ගැටළු විසදීමට හැකිවන ලෙස සංශෝධනය කිරීම සඳහා 2011 වර්ෂයේදී සකස්කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුමත කරමින් පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා පත්කරන ලද විද්වත් කමිටුව විසින් සකස් කරන ලද වාර්තාව අධ්‍යයනය කරන ලදී.

- 2012 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන ලබාදී තිබූ
  - දෙහිවල ජාතික නිවාස ක්‍රමය
  - කින්දවත්ත ජාතික නිවාස ක්‍රමය
  - කොළඹ 12 ඩයස් පෙදෙස අඩියර , ජාතික නිවාස ක්‍රමය
  - කොළඹ 12 අළුත්කඩේ ජාතික නිවාස ක්‍රමය
  - දිසානායක වත්ත ජාතික නිවාස ක්‍රමය
  - කම්කරුපුර ජාතික නිවාස ක්‍රමය

නිවාස ක්‍රමවල ප්‍රතිසංස්කරණ කටයුතු වල ප්‍රගතිය නිරතුරුවම විමර්ශනය කරන ලදී.

- 2005. 2006.2007.2008.2009 යන වර්ෂවලට අදාලව පොදු ව්‍යාපාර කාරක සභාව වෙත ඉදිරිපත් කලයුතු විගණන වාර්තා විමර්ශනය කර ඒ සඳහා අවශ්‍ය විසඳුම් ලබාදීම.
- අධිකාරියේ අඩමානණය සහ බොල්ණය ප්‍රතිපත්තින් සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.
- දිගුකාලීනව පැවතෙන ගිණුම් ශේෂයන් පොත්වලින් කපා

හැරීම සම්බන්ධයෙන් අවශ්‍ය නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

- අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සහ උපදෙස් දීම.
- 2012 අයවැය ලේඛණය සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබාදීම සහ 2012 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.
- පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ පදනම් කරගෙන අධිකාරියේ සංයුක්ත සැලැස්ම 2012-2016 වර්ෂ සඳහා යාවත්කාලීන කර සකස් කිරීම.
- ගොඩනැගිලි ඉදිකර වසර 80කට වඩාපැරණි කොළඹ 14 පිහිටි වේලස් කුමාර මාවත නිවාස ක්‍රමය සහ වසර 40 කට වඩා පැරණි කොළඹ 02 වැකන්ද නිවාස ක්‍රමය අවදානම් තත්වයකට පත්වී ඇති බැවින් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරී පනතේ 5 ඕ වගන්තිය අනුව නැවත සංවර්ධනය කිරීමේ සැලසුම් සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමුකරවීම.
- තවද පහත සඳහන් කරුණු විගණන හා කළමනාකරණ කමිටුව නිරන්තරයෙන් විමර්ශනයට භාජනය කරන ලදී.
  - අයවැය විචලන වාර්තාව
  - මුල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා
  - මුදල් ප්‍රවාහ සහ ද්‍රවශීලතාවය
  - බැංකු සැසඳුම් වාර්තා
  - මානව සම්පත් කළමනාකරණ පිළිබඳ වාර්තාව
- අයවැය ලේඛනයේ ඉලක්කයන් සපුරාගැනීම සම්බන්ධයෙන් නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

# මූල්‍ය ප්‍රකාශය 2012

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශය (ශේෂ පත්‍රය)

# සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
## 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශය (ශේෂ පත්‍රය)

| 2011 රුපියල් | වත්කම් | | | 2012 රුපියල් |
|---|---|---|---|---|
| | ජංගම නොවන වත්කම් | | | |
| | ස්ථාවර වත්කම් | | | |
| 9,656,419 | දේපල පිරියත් සහ උපකරණ | සටහන 01 | | 26,778,214.78 |
| | ආයෝජන | | | |
| | දිගු කාලීන ආයෝජන | | | |
| 3,000,000 | නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැකුවේ කොටස් | | | 3,000,000.00 |
| 12,656,419 | | | | 29,778,214.78 |
| | ජංගම වත්කම් | | | |
| 470,505 | තොග | සටහන 02 | 544,212.62 | |
| 23,233,232 | වෙළඳ ණයගැතියෝ, සේවක ණය සහ ලැබිය යුතු ශේෂ | සටහන 03 | 22173,854.86 | |
| 127,502 | වෙනත් ලැබිය යුතු ශේෂ | සටහන 04 | 800,156.36 | |
| 98,018 | ඉදිරියට කළ ගෙවීම් | සටහන 05 | 118,668.00 | |
| 10,497,670 | කෙටිකාලීන ආයෝජන | සටහන 06 | 44,342,989.85 | |
| 7,015,003 | මුදල් හා මූල්‍යමය අයිතම | සටහන 07 | 1,628,873.59 | |
| 41,441,930 | | | | 69,608,755.28 |
| 54,098,349 | මුළු වත්කම් | | | 99,386,970.06 |
| | වගකීම් | | | |
| | ජංගම වගකීම් | | | |
| | ලංකා බැංකු කල්බදු ණය | සටහන 08 | 2,796,428.52 | |
| 14,421,809 | ගෙවිය යුතු | සටහන 09 | 31,220,939.07 | |
| 1,675,327 | උපචිත වියදම් | | 1,678,934.72 | |
| 42,153,042 | ණයහිමියෝ / අත්තිකාරම් | සටහන 10 | 43,382,749.05 | |
| 27,642,455 | ප්‍රතිපාදන | සටහන 11 | 26,542,287.12 | 105,621,338.48 |
| 85,892,633 | මුළු ජංගම වගකීම් | | | 105,621,338.48 |
| | ජංගම නොවන වගකීම් | | | |
| | කල් බදු ණය | සටහන 08 | | 9,554,464.36 |
| 85,982,633 | මුලු වගකීම් | | | 115,175,802.84 |
| 31,794,284 | | | | |
| | ශුද්ධ වත්කම් එකතුව | | | 15,788,832.78 |
| | ශුද්ධ වත්කම් / නියෝජනය වන්නේ | | | |
| 500,000 | අනුදත් ප්‍රාග්ධනය | | | 500,000 |
| 500,000 | රජයේ ප්‍රාග්ධනය | | | 500,000.00 |
| 2,500,000 | ප්‍රසාද කොටස් | | | 2,500,000.00 |
| 3,000,000 | | | | 3,000,000.00 |
| | එකතුව | | | |
| (41,763,291) | එකතු වු අරමුදල් | | | |
| | පෙර වර්ෂය වෙනුවෙන් ගැලපුම් | | (60,715,712.63) | |
| (18,952,422) | වර්ෂය තුළ අතිරික්තය (ඌණතාවය) | | 16,005,451.53 | (44,710,261.10) |
| 22,308,765 | ප්‍රත්‍යාගණන සංචිත | | | 22,308,765.04 |
| 1,350,000 | පොදු සංචිතය | | | 1,350,000.00 |
| 2,262,663 | ප්‍රාග්ධනය මාරුකිරීම | | | 2,262,663.28 |
| (31,794,283) | ශුද්ධ වත්කම් / හිමිකම් එකතුව | | | (15,788,832.78) |

නීතිඥ කපිල ගමගේ
සභාපති

ජී යූ උපවංශ
සාමාන්‍යාධිකාරි

කේ එම් ඒ උපාලි
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

# සහාධිපත්‍ය කළමණාකරන අධිකාරිය

## 2012 ජනවාරි 01 දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව

| 2011 රුපියල් | | | 2012 රුපියල් |
|---|---|---|---|
| | ආදායම් | | |
| 42,519,125 | මෙහෙයුම් ආදායම් | සටහන් 12 | 38,192,179 |
| 1,849,100 | වෙනත් මෙහෙයුම් ආදායම් | සටහන් 13 | 2,050,527 |
| 317,477 | මෙහෙයුම් නොවන ආදායම් | සටහන් 14 | 1,272,416 |
| 44,685,702 | | | 41,515,122 |
| 44,685,702 | වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම් | | 39,050,000 |
| | මුලු පිරිවැටුම | | 80,565,122 |
| | මෙහෙයුම් වියදම් | | |
| 43,264,198 | සේවක වැටුප් හා දීමනා | සටහන් 15 | 49,043,661 |
| 600,038 | ගමන් වියදම් | | 788,879 |
| 3,947,284 | සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය | සටහන් 16 | 4,883,606 |
| 4,484,134 | නඩත්තු වියදම් | සටහන් 17 | 4,748,028 |
| 3,240,426 | ව්‍යවස්ථාපිත වියදම් | සටහන් 18 | 4,225,177 |
| 705,146 | සෘජු වියදම් | සටහන් 19 | 1,591,652 |
| 5,322,077 | ක්ෂයවීම් | | 3,537,805 |
| 625,451 | ව්‍යාපෘති වියදම් | සටහන් 20 | 707,594 |
| 387,915 | වෙනත් මෙහෙයුම් වියදම් | සටහන් 21 | 95,900 |
| 62,567,699 | මුළු මෙහෙයුම් වියදම් | | 69,622,302 |
| (17,881,697) | අතිරික්තය/(ඌණතාවය) | | 10,942,820 |
| 888,350 | මූල්‍ය වියදම් | සටහන් 22 | 1,431,705 |
| 182,105 | මෙහෙයුම් නොවන වියදම් | සටහන් 23 | 553,158 |
| 1,070,455 | මුළු මෙහෙයුම් නොවන වියදම් | | 1,984,863 |
| | අතිරික්තය/(ඌණතාවය) | | 8,957,957 |
| | ප්‍රාග්ධන වත්කම් විකිණීමේ අතිරික්තය / (ඌණතාවය) | සටහන් 24 | 7,047,495 |
| (18,952,422) | බදු අඩු කිරීමට පෙර ශුද්ධ අතිරික්තය / (ඌණතාවය) | | 16,005,452 |
| | ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | | |
| (18,952,422) | ශුද්ධ අතිරික්තය / (ඌණතාවය) | | 16,005,452 |
| (41,763,291) | පසුගිය වසරින් ඉදිරියට ගෙන ආ එකතු වූ අතිරික්තය / (ඌණතාවය) | | (60,715,713) |
| 60,715,713 | | | 44,710,261 |
| | පෙර වර්ෂයට අදාල ගැලපුම් | | |
| _ | හර එකතුව | | - |
| _ | බැර එකතුව | | - |
| 60,715,713 | | | (44,710,261) |

# ගිණුම් සඳහා සටහන්

## 1 ගිණුම් පිළිබඳ සටහන්

මූල්‍ය වාර්තා පිළිබඳව කළමනාකරණයේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම තුලින් අවස්ථානෝචිත පරිදි සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කර ගනිමින් මෙම ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මනා අභ්‍යන්තර පාලනයක් සැළසුම් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීමට හා පවත්වා ගෙන යාම තුලින් සාධාරණ ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බවට සහතික වෙමු.

## 2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව අන්‍යෝන්‍ය වශයෙන් කාල පරිච්ඡේද පිළිබඳව අන්තර් සම්බන්ධතාවයකින් යුක්තව ඓතිහාසික අය පදනම මත අධිකාරියේ ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රතිපත්ති වලට බලපෑ හැකි උද්ධමනකාරී සාධක අරභයා ගැලපුම් කිරීමක් කර නැති අතර උපචිත පදනම මත ගිණුම් වාර්තා සකස් කර ඇත.

## 3 ස්ථාවර වත්කම්

ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන් කිරීමේදි අධිකාරියේ ප්‍රතිපත්තිය අනුව මිලදී ගත් දින සිට විකුණන දිනය දක්වා සරල මාර්ග ක්‍රමය මත ක්ෂය වෙන් කිරීම සිදු කෙරේ.

| | |
|---|---|
| මෝටර් රථ | 25% |
| කාර්යාල ලී බඩු | 20% |
| යන්ත්‍ර හා උපකරණ | 20% |
| කාර්යාල උපකරණ | 20% |
| ගොඩනැගිලි | 04% |

## 4 පාරිතෝෂිත

අවම වශයෙන් වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කල සේවකයින් වෙනුවෙන් පාරිතෝෂිත ගෙවිය යුතු වටිනාකම් සඳහා ගිණුම් වල වෙන් කිරීම කරනු ලැබ ඇත. 2012 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂයට අදාල එම වටිනාකම රු.20,640,107 වේ.

## 5 තොග

තොග මිලදී ගැණුම පිරිවැය මත ආගණනය කර ගිණුම් වල ගැලපීම් කර ඇති අතර කිසිඳු ලාභ මුදලක් ඊට ඇතුලත් කර නොමැත.

## 6 ආදායම

දල ආදායම පදනම් කර ගනිමින් ලාභාංශ ගිණුම් සකසා ඇත.

## 7 බොල් හා අඩමාණ ණය වෙන් කිරීම්

වර්ෂ අවසානයේ පවත්නා වෙළඳ ණයගැතියන්ගේ හඳුනා නොගත් අයකර ගත නොහැකි ශේෂයන් සඳහා පමණක් බොල් හා අඩමාන ණය වශයෙන් ගිණුම් වල වෙන් කිරීම් සිදු කිරීම අධිකාරියේ ප්‍රතිපත්තිය වේ. එවැනි ණයගැතියන් සඳහා මේ වන විට රු.3,857,864 ක මුදලක් බොල් ණය හා අඩමාණ ණය වශයෙන් ගිණුම් වල වෙන් කිරීම් කර ඇත.

2012/12/31 දිනට මෙවැනි ණයගැතියන් හඳුනා ගෙන නොමැති බැවින් 2012 වර්ෂය සඳහා වෙන් කිරීම් සිදු කර නොමැත.

## 8 අසම්භාව්‍ය වගකීම්

ලංකා කෙට් (පුද්) සමාගමෙන් අයවිය යුතුව ඇති රු.807,187.50 ක මුදල අය කර ගැනීම සඳහා නඩු අංකය 53429/එම් ආර් යටතේ කොළඹ දිසා අධිකරණය යටතේ නඩු පවරා ඇත. අධිකාරියට හෝ අධිකාරිය විසින් පවරන ලද නඩු සඳහා අසම්භාව්‍ය වගකීමක් නොමැති බැවින් ඒ සඳහා ගිණුම් වල වෙන් කිරීම් සිදු කර නොමැත.

| | දේපල පිරියත සහ උපකරණ | 2012/01/01 දිනට පිරිවැය | වර්ෂය තුල අත්පත් කර ගැනීම් | වර්ෂය තුල බැහැර කිරීම් | සටහන 01<br>2012/12/31 දිනට පිරිවැය |
|---|---|---|---|---|---|
| 1,520,000 | කතරගම සංචාරක බංගලා ඉඩම | 1,520,000.00 | - | - | 1,520,000.00 |
| 6,700,000 | කතරගම සංචාරක බංගලා ගොඩනැගිල්ල | 6,700,000.00 | - | - | 6,700,000.00 |
| 1,848,454 | කාර්යාල ලී බඩු සහ උපාංග | 1,848,455 | 7300 | - | 1,855,755 |
| 16,740,000 | මෝටර් රථ | 16,740,000 | 19,785,714 | 7,125,000 | 29,400,714 |
| 821,486 | යන්ත්‍ර සහ උපකරණ | 821,486 | 182,655 | - | 1,004,141 |
| 1,954,340 | මෙවලම් සහ උපකරණ | 1,954,340 | 708,931 | 25,000 | 2,638,271 |
| 295,84,280 | | 29584281 | 20,684,600 | 7,150,000 | 43,118,881 |

| | අඩු කලා ක්ෂය ප්‍රතිපාදන | 2012/01/01 දිනට සමුච්චිත ක්ෂය වෙන්කිරීම් | වර්ෂය සඳහා ක්ෂය වෙන් කිරීම් | බැහැර කිරීම් සඳහා ක්ෂය වෙන්කිරීම් | 2012/12/31 දිනට සමුච්චිත ක්ෂය වෙන් කිරීම |
|---|---|---|---|---|---|
| 1,072,000 | කතරගම සංචාරක බංගලා ගොඩනැගිල්ල | 1,072,000 | 268,000 | - | 1,340,000 |
| 1,256,301 | කාර්යාල ලී බඩු සහ උපාංග | 1,256,301 | 370,015 | - | 1,626,316 |
| 16,263,542 | මෝටර් රථ | 16,263,542 | 2,291,023 | 7,125,000 | 11,429,564 |
| 248,878 | යන්ත්‍ර සහ උපකරණ | 248,878 | 172,363 | - | 421,241 |
| 1,087,140 | මෙවලම් සහ උපකරණ | 1,087,140 | 436,404 | - | 1,523,545 |
| 19,927,861 | | 19,927,861 | 3,537,805 | 7,125,000 | 16,340,666 |
| 9,656,419 | 2011/12/31 දිනට ලියා හරින ලද වටිනාකම | | | - | 26,778,215 |

| | තොග ගිණුම් | සටහන 02 |
|---|---|---|
| 136,004 | මෙහෙයුම් අංශයේ තොග | 135,570 |
| 72,037 | ප්‍රධාන කාර්යාල තොග | 80,254 |
| 262,464 | කාර්යාල සැපයුම් තොග | 328,389 |
| 470,505 | | 544,213 |

| | වෙළඳ ණය ගැතියෝ, හා වෙනත් ලැබිය යුතු විවිධ තැන්පතු | | සටහන 03 |
|---|---|---|---|
| 248,990 | ලැබිය යුතු විවිධ තැන්පතු | උපලේඛණ 01 | 253,066 |
| 19,142,319 | සේවා යෝජක ණයකරුවන් | උපලේඛණ 02 | 17,778,679 |
| 3,841,923 | කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම් | උපලේඛණ 03 | 4,142,110 |
| 23,233,232 | | | 22,173,855 |

| | වෙනත් ලැබිය යුතු | සටහන 04 |
|---|---|---|
| 127,502 | රඳවා ගැනීම් බදු | 133,101 |
| - | එක්දින තැන්පතු පොලී | 667,054 |
| 127,502 | | 800.155 |

| | ඉදිරියට කළ ගෙවීම් | සටහන 05 |
|---|---|---|
| 56,865 | ඉන්ධන දීමනා | 85,065 |
| 41,153 | වාහන ලියාපදිංචි ගාස්තු | 33,603 |
| 98,018 | | 118,668 |

| | කෙටිකාලීන ආයෝජන | | සටහන 06 |
|---|---|---|---|
| 2,120,846 | ඉතිරිකිරීම් තැන්පතු - මහජන බැංකුව | | 685,244 |
| 7,079,043 | එඩ්මන්ටන් රජයේ නිවාස ක්‍රමයේ නිදන්ගත අරමුදල් ආයෝජන | | 7,810,432 |
| 1,297,781 | පාරිතෝෂිත වෙන් කිරීම් ආයෝජන | | 1,847,314 |
| - | සත්දින තැන්පතු - මහජන බැංකුව | | 34,000,000 |
| 10,497,670 | | | 44,342,990 |

| | මුදල හා මූල්‍යමය අයිතම | | සටහන 07 |
|---|---|---|---|
| 7,015,003 | බැංකු සහ අතැති මුදල් | උපලේඛණ 04 | 1,628,874 |
| 7,015,003 | | | 1,628,874 |

| | ලංකා බැංකු - කල් බදු ණය | | සටහන 08 |
|---|---|---|---|
| - | මුලු කල් බදු ණය මුදල | | 17,912,410 |
| | අඩු කලා | | |
| - | මුලු කල් බදු ණය පොලිය | | 5,561,517 |
| | | | 12,350,893 |
| - | ජංගම වගකීම් | | 2,796,429 |
| - | ජංගම නොවන වගකීම් | | 9,554,464 |
| - | මුලු වගකීම් | | 12,350,893 |

| | ගෙවිය යුතු | | සටහන 09 |
|---|---|---|---|
| 344,333 | කාර්යාල කුලී | | 688,666 |
| 10,150,458 | කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු | | 21,896,279 |
| 486,478 | උපචිත වගකීම් | උපලේඛණ 05 | 483,129 |
| 793,232 | සැපයුම් සඳහා ගෙවීම් | | 532,907 |
| 1,159,088 | රඳවාගත් මුදල් | | 4,109,814 |
| 173,100 | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් ගාස්තු | | 896,600 |
| 1,315,121 | ආරක්ෂිත තැන්පතු | උපලේඛණ 06 | 2,613,544 |
| 14,421,810 | | | 31,220,939 |

| | ණය හිමියන් සහ අත්තිකාරම් | | සටහන 10 |
|---|---|---|---|
| 2,854,729 | ගණුදෙනුකරුවන්ගෙන් ලැබෙන අත්තිකාරම් | උපලේඛණ 07 | 1,599,750 |
| 39,298,313 | විවිධ ණය හිමියන් | උපලේඛණ 08 | 41,782,999 |
| 42,153,042 | | | 43,382,749 |

| | ප්‍රතිපාදන | | සටහන 11 |
|---|---|---|---|
| 2,115,639 | විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | | 1,989,330 |
| 18,102,966 | පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | | 20,640,107 |
| 65,986 | සේවක වන්දි සඳහා ප්‍රතිපාදන | | 54,986 |
| 3,857,864 | බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන | | 3,857,864 |
| 3,500,000 | බම්බලපිටිය නිවාස ක්‍රමය නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති වාර්ථා සකස් කිරීමේ වියදම් සඳහා ප්‍රතිපාදන | | |
| 27,642,455 | | | 26,542,287 |

| | මෙහෙයුම් ආදායම | | සටහන 12 |
|---|---|---|---|
| 7,089,261 | සේවා ගාස්තු ආදායම | උපලේඛණ 09 | 7,757,486 |
| 27,712,898 | සභාධිපත්‍ය දේපල සඳහා සහතික නිකුත් කිරීමේ ආදායම | උපලේඛණ 10 | 21,526,941 |
| 6,817,808 | අලුත්වැඩියා හා නඩත්තු ආදායම | උපලේඛණ 11 | 8,047,852 |
| 2,395,332 | විවිධ මෙහෙයුම් ආදායම් | උපලේඛණ 12 | 859,900 |
| 56,454,482 | | | 38,192,179 |

| | වෙනත් මෙහෙයුම් ආදායම | | සටහන 13 |
|---|---|---|---|
| 40,500 | ටෙන්ඩර් ඉල්ලුම්පත් ආදායම | | 152,000 |
| 759,610 | ලියාපදිංචි කිරීමේ ගාස්තු | උපලේඛණ 13 | 1078,950 |
| 74,550 | ඉල්ලුම් පත්‍ර ගාස්තු | | 84,750 |
| 647,000 | සමතකරණ ගාස්තු | | 707,727 |
| 2,550 | සභාධිපත්‍ය ප්‍රකාශන ආදායම | | 11,500 |
| 1,050 | සභාධිපත්‍ය සඟරා ආදායම | | - |
| 66,500 | දැන්වීම් අනුග්‍රාහකත්වය සඳහා ලැබීම් | | - |
| 24,100 | පරිපාලන ගාස්තු | | 15,600 |
| 233,240 | අනවසර ඉදිකිරීම් ඉවත්කිරීමෙන් ලැබූ ආදායම් | | - |
| 1,849,100 | | | 2,050,527 |

| | මෙහෙයුම් නොවන ආදායම | | සටහන 14 |
|---|---|---|---|
| 4,000 | දඩ හා වෙනත් අයකර ගැනීම | | 28,700 |
| 109,047 | සේවක ණය සඳහා පොළිය | | 124,021 |
| 150,000 | ලාභාංශ | | |
| 35,053 | ඉතිරිකිරීම් සඳහා පොළිය | | 119,531 |
| 19,377 | සභාධිපත්‍ය විස්තර ලැයිස්තු නිකුත් කිරීම මගින් ලැබූ ආදායම | | 5,000 |
| - | සත්දින තැන්පතු සඳහා පොලිය | | 995,164 |
| 317,477 | | | 1,272,416 |

| | සේවක වැටුප් සහ දීමනා | | සටහන 15 |
|---|---|---|---|
| 630,000 | සභාපති දීමනා | | 720,000 |
| 330,000 | සභාපති නිවාස කුලී දීමනා | | 360,000 |
| 30,085,608 | වැටුප් හා වේතන | | 32,971,790 |
| 2,676,052 | සේවක අර්ථ සාධක අරමුදල | | 2,784,001 |
| 669,013 | සේවක භාරකාර අරමුදල | | 692,656 |
| 5,933,331 | අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | | 7,136,585 |
| 102,400 | ප්‍රසාද දීමනා | | 105,400 |
| - | දිරි දීමනා | | 256,250 |
| 2,492,794 | පාරිතෝෂිත | | 3,409,679 |
| 261,000 | අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | | 546,000 |
| | සේවක සුභ සාධන | | 546,000 |
| 64,000 | සේවක පුහුණුකිරීම් | | 58,800 |
| 20,000 | සේවක වන්දි | | 2,500 |
| 43,264,198 | | | 49,043,661 |

| | සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය | සටහන 16 |
|---|---|---|
| 1,234,127 | මුද්‍රණ කටයුතු සහ ලිපි ද්‍රව්‍ය | 1,030,688 |
| 787,656 | තේ වියදම් | 828,103 |
| 1,079,897 | මොටර් රථ සඳහා ඉන්ධන | 2,044,356 |
| 614,535 | ඉන්ධන දීමනා | 858,180 |
| 231,069 | කාර්යාල සැපයුම් | 122,279 |
| 3,947,284 | | 4,883,606 |

| | නඩත්තු වියදම් | සටහන 17 |
|---|---|---|
| 3,437,842 | වාහන අලුත්වැඩියා සහ නඩත්තු | 3,647,808 |
| 89,110 | පරිගණක අලුත්වැඩියා සහ නඩත්තු | 60,275 |
| 149,098 | කතරගම සංචාරක නිවාස නඩත්තු | 240,345 |
| 239,120 | ලී බඩු උපාංගල යන්ත්‍ර සහ උපකරණ නඩත්තු | 256,694 |
| 439,120 | කාර්යාල ගොඩනැගිලි නඩත්තුව | 401,293 |
| 129,844 | කාර්යාල නඩත්තුව | 141,613 |
| 4,484,134 | | 4,748,028 |

| | ව්‍යවස්ථාපිත වියදම් | සටහන 18 |
|---|---|---|
| 360,391 | විදුලිය | 427,601 |
| 917,539 | දුරකතන | 909,064 |
| 203,750 | රක්ෂණය | 406,517 |
| 252,932 | ජල බිල් | 151,265 |
| 17,027 | වාහන බලපත්‍ර ගාස්තු | 55,800 |
| 133,476 | තැපැල් හා විදුලි පණිවිඩ ගාස්තු | 123,135 |
| 635,277 | නීතිඥ ගාස්තු | 1,106,879 |
| 139,012 | දැන්වීම් ගාස්තු | 224,616 |
| 28,148 | මාර්ගස්ථ මුදල් රක්ෂණ ගාස්තු | 28,148 |
| 108,937 | ප්‍රචාරන වියදම් | 289,635 |
| 72,545 | පුවත්පත් | 82,360 |
| 307,440 | කාර්යාල බදු කුළී | 307,440 |
| 63,952 | භාෂා පරිවර්තන ගාස්තු | 90,217 |
| - | අභියාචනා කමිටු වියදම් | 22,500 |
| 3,240,426 | | 4,225,177 |

| | සෘජු වියදම් | | සටහන 19 |
|---|---|---|---|
| 119,745 | සහතික නිකුත් කිරීමේ වියදම් | | 211,050 |
| 481,678 | අලුත්වැඩියා සහ නඩත්තු වියදම් | උපලේඛණ 14 | 860,704 |
| 103,723 | සමතකරණ ගාස්තු | | 519,898 |
| 705,146 | | | 1,591,652 |

| | ව්‍යාපෘති වියදම් | සටහන 20 |
|---|---|---|
| 368,860 | ජනසෙවන ව්‍යාපෘතිය | 17,940 |
| 83,555 | සම්මන්ත්‍රණ වියදම් | 76,895 |
| 173,036 | සභාධිපත්‍ය පුවත්පත | 590,250 |

| | | |
|---|---|---|
| - | සුනාමි නි/ක්‍රමවල කළමනාකරණ සංස්ථා පිහිටුවීම | 22,509 |
| 625,451 | | 707,594 |
| | **වෙනත් මෙහෙයුම් වියදම්** | **සටහන 21** |
| 378,915 | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම | 95,900 |
| 378,915 | | 95,900 |
| | **මූල්‍ය වියදම්** | **සටහන 22** |
| 350,000 | විගණන ගාස්තු | 345,872 |
| 8,790 | හර බදු | 250 |
| 4,397 | බැංකු ගාස්තු | 3,250 |
| 5,000 | ප්‍රසම්පාදන වියදම් | 7,000 |
| 279,146 | බොල් හා අඩමාණ ණය | - |
| 54,195 | තොග ගැලපුම් | - |
| 26,921 | උපයන විට ගෙවීම් බදු | 6,503 |
| 7,942 | ජාතිය ගොඩනැගීමේ බදු | - |
| 151,959 | බැංකු ණය පොලිය | - |
| - | තොග සමීක්ෂණ කමිටු ගාස්තු | 18,000 |
| - | සානුකම්පිත ගෙවීම් | 10,000 |
| - | වාහන කල් බදු මුද්දර ගාස්තු | 202,790 |
| - | කල් බදු පොලී | 734,540 |
| - | අර්ධ සුඛෝපභෝගී බදු | 40,000 |
| - | වෙබ් අඩවි නිර්මාණය කිරීම | 36,000 |
| - | සභාධිපත්‍ය පනත සංශෝධනය කිරීම | 27,500 |
| 888,350 | | 1,431,705 |
| | **මෙහෙයම් නොවන වියදම්** | **සටහන 23** |
| 3,085 | සභාපති හමුවීමට පැමිණෙන්නන්ට සංග්‍රහ වියදම් | 25503 |
| 117,987 | විවිධ වියදම් | 90157 |
| _ | දැයට කිරුළ ප්‍රදර්ශනය | 13190 |
| _ | ලෝක ජනාවාස දින සැමරුම - තුන්කල් දැක්ම | 409308 |
| 20,563 | වෙළෙඳනාම ලබා ගැනීමේ වියදම් | _ |
| 40,470 | ඉක්ටැඩ් ආයතනයේ ලියාපදිංචි ගාස්තු | 15000 |
| 182,105 | | 553,158 |
| | **ප්‍රාග්ධන වත්කම් විකිණීමේ අතිරික්තය (ඌනතාවය)** | **සටහන 24** |
| _ | වාහන විකිණීමෙන් ලැබුණු මුදල | 7,047,495 |
| _ | එකතු කලා විකිණූ වාහන පිරිවැය | 7,125,000 |
| _ | | 1,472,495 |
| _ | අඩු කලා විකිණූ වාහන ක්ෂය වෙන් කිරීම් | 7,125000 |
| _ | ප්‍රාග්ධන වත්කම් විකිණීමේ අතිරික්තය | 7,047,495 |

| | විවිධ තැන්පතු | උපලේඛණ 1 |
|---|---|---|
| 79,511 | සේවක ආරක්‍ෂක තැන්පතු ආයෝජන | 83,587 |
| 100,000 | ඉන්ධන තැන්පතු | 100,000 |
| 69,479 | ටෙලිකොම් තැන්පතුව<br>විදුලි බලය සැපයුම් සඳහා ගාස්තු<br>ලංකා ඔක්සිජන් සිලින්ඩර් සඳහා තැන්පතුව<br>තැපැල් මුද්‍රාව භාවිතය සඳහා තැන්පතුව | 69,479 |
| 248,990 | | 253,066 |

| | ණයගැතියෝ | උපලේඛණ 2 |
|---|---|---|
| 1,005,698 | මාදිවෙල පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය | 777,428 |
| 1,722,027 | උඩුමුල්ල පුරාණ විහාරය | 1,722,027 |
| 1,704,633 | ගම්පහ රෝහල | 1,996,017 |
| 807,188 | ලංකා කෙට් (පුද්) සමාගම | 807,187 |
| 881,465 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 881,465 |
| 189,129 | රථ ගාල (මාලිගාවත්ත) | 189,129 |
| 147,812 | ගම්පහ නිවාස ක්‍රම නඩත්තුව ජා නි ස අධිකාරිය | 147,812 |
| 2,439,871 | ෆැට්ග්නම් රියල්ටි ඉන්වෙස්ට්මන්ට් | 2,439,871 |
| 924,228 | සමතකරණ ගාස්තු | 1,371,530 |
| 5,025,054 | විමධ්‍යගත සහ පළාත් සභා අරමුදල් | 2,918,915 |
| 545,773 | ජල්තර රජයේ සේවක නිවාස ක්‍රමයේ විදුලි බිල් | 433,884 |
| 278,772 | මීගමුව රෝහල - පොම්පාගාර නඩත්තු | 650,942 |
| 2,416,719 | එල්.එච්.පී ප්‍රොපර්ටි ඩිවලොපර්ස් (පුද) සමාගම | 2,416,719 |
| 63,027 | සීගල් ඩිවලොප්මන්ට් (පුද්) සමාගම | 63,027 |
| 785,335 | සන්සිටි ප්‍රොපර්ටි ඩිවලොපර්ස් (පුද්) සමාගම | _ |
| 8,557 | ජේ ගුරුගේ | 8,557 |
| 11,891 | ආර් එච් එස් විජේපාල | 11,891 |
| 182,784 | කේ එච් ටී සී සිල්වා | 216,477 |
| 2,357 | පියෝටා මෝටර්ස් | 2,357 |
| _ | ගම්පහ සංවර්ධන සමාගම | 39,224 |
| _ | බ්ලූ ඕෂන් අපාර්ට්මන්ට් - අලුත්මාවත | 77,195 |
| _ | බ්ලූ ඕෂන් අපාර්ට්මන්ට් - සමුද්‍ර මාවත | 607,025 |
| 19,142,319 | | 17,778,679 |

| | ණය සහ අත්තිකාරම් | උපලේඛණ 3 |
|---|---|---|
| 7,753 | ටී පී සිරියාවති | 7,753 |
| 13,455 | මිල්දී ගැනීම් අත්තිකාරම් | _ |
| 200,000 | විශේෂ අත්තිකාරම් | _ |
| 2,896,548 | ආපදා ණය | 3,861,524 |
| 101,667 | විශේෂ ආපදා ණය | 155,833 |
| 107,500 | උත්සව අත්තිකාරම් | 117,000 |
| 515,000 | විශේෂ ණය | _ |
| 3,841,923 | | 4,142,110 |

| | බැංකු සහ අතැති මුදල් | උපලේඛණ 4 |
|---|---|---|
| 5,141,464 | මහජන බැංකුව - ගිණුම් අංක - 204-1-001-0081817 | 280,933 |
| 39,087 | මහජන බැංකුව - ගිණුම් අංක - 204-1-002-09 - 0081817 | 140,151 |
| 1,834,452 | ලංකා බැංකුව ගිණුම් අංක - 0000351042 | 1,207,790 |
| 7,015,003 | | 1,628,874 |

| | උපචිත වගකීම් | උපලේඛණ 5 |
|---|---|---|
| 409,993 | ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් | 419,345 |
| 5,575 | මුද්දර ගාස්තු | 6,300 |
| _ | තෙවන පාර්ශවීය අඩුකිරීම් | 300 |
| 13,693 | ගෙවිය යුතු රඳවා ගත් බදු | _ |
| 55,908 | ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් | 57,184 |
| 1,309 | ගෙවිය යුතු උපයන විට බදු | _ |
| 486,478 | | 483,129 |

| | ආරක්ෂක තැන්පතු | උපලේඛණ 6 |
|---|---|---|
| 1,235,610 | කොන්ත්‍රාත්කරුවන්ගේ අරක්ෂක තැන්පතු | 2,529,957 |
| 79,511 | සේවක ආරක්ෂක තැන්පතු | 83,587 |
| 1,315,121 | | 2,613,544 |

| | ගණුදෙනුකරුවන්ගේ ලැබෙන අත්තිකාරම් | උපලේඛණ 7 |
|---|---|---|
| 104,453 | ලංකා විදුලි බල මණ්ඩලය | 104,453 |
| 1,144,729 | නගමු පුරවර උපලේඛණ 15 | 1,144,729 |
| 1,229,974 | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | _ |
| 375,573 | අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම | 350,568 |
| 2,854,729 | | 1,599,750 |

| | විවිධ ණය හිමියන් | උපලේඛණ 8 |
|---|---|---|
| 9,350,215 | නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය | 9,125,215 |
| 15,733,971 | භාණ්ඩ හා සේවා බදු | 15733,971 |
| 2,647,661 | එකතු කල අගය මත බදු | 3,194,996 |
| 519,327 | ජාතිය ගොඩනැගීමේ බදු | 606,912 |
| 3,370 | විවිධ අත්තිකාරම් | 3,435 |
| 223,014 | ධීවර දෙපාර්තමේන්තුව | 223,014 |
| 7,079,044 | එඩ්මන්ටන් රජයේ සේවක නිවාස ක්‍රමයේ නිදන්ගත අරමුදල් | 7,810,432 |
| 919,831 | සර්පන්ටයින් රජයේ නිවාස ක්‍රමයේ නඩත්තු අරමුදල | 599,899 |
| 7,771 | පී එම් කේ දිනේෂ් අසංක | 7,770 |
| 1,300,000 | බී එම් ජී ආර් කේ බානගේතැන්න | 325,000 |
| 1,400,000 | එස් පී සී කේ ප්‍රනාන්දු | 350,000 |
| 94,980 | ඇරෝරේ | _ |
| 5,131 | ස්වයංසවිය “සොයිසාපුර නිවාස ක්‍රමය“ | 6,865 |
| 6,573 | මැකාර්ති ටවර් | _ |
| 7,425 | ලුනාව සමුද්‍ර ශක්ති කළමනාකරණ සංස්ථාව | 93,825 |
| _ | නීතිපති දෙපාර්තමේන්තුව | 1,024,800 |
| _ | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 78,985 |
| _ | පැන් ආර්චි- කුමුදු එස් මුණසිංහ | 2,450,000 |
| _ | එක්ස් පෝ ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් | 6,573 |
| _ | ෆෙයාරිස් යෝන් මැරින් | 3,146 |

| | | |
|---|---|---|
| _ | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 127,411 |
| _ | සුප්‍රීම් මාර්කටින් සර්විස් | 10,750 |
| 39,298,313 | | 41,782,999 |

| | සේවා ගාස්තු ආදායම | උපලේඛණ 09 |
|---|---|---|
| 5,043,841 | ව්‍යාපෘති සේවා ගාස්තු | 7,629,572 |
| 1,786,372 | විමධ්‍යගත / පළාත් සහා ව්‍යාපෘති සේවා ගාස්තු | 117,020 |
| 259,048 | වෙනත් සේවා ගාස්තු | 10,894 |
| 7,089,261 | | 7,757,486 |

| | සහාධිපත්‍ය දේපළ සඳහා සහතික නිකුත් කිරීම | උපලේඛණ 10 |
|---|---|---|
| 15,010,243 | ඉදිකර අවසන් කර ඇති දේපළ සඳහා නිකුත් කරන ලද සහතික | 18,638,204 |
| 12,214,068 | ඉදිකිරීම් ආරම්භ කරන ලද දේපළ සඳහා නිකුත් කරන ලද සහතික | 2,332,445 |
| 144,855 | අර්ධ ඉදිකිරීම් සඳහා නිකුත් කරන ලද සහතික | 54,292 |
| _ | සහාධිපත්‍ය සහතික අලුත්කිරීමේ ගාස්තු | 260,000 |
| 343,732 | මූලික සැලසුම් අනුකූලතා සහතික | 242,000 |
| 27,712,898 | | 21,526,941 |

| | අලුත්වැඩියා සහ නඩත්තු ආදායම් | උපලේඛණ 11 |
|---|---|---|
| 2,658,037 | මාදිවෙල පාර්ලිමේන්තු නිවාස සංකීර්ණය නඩත්තු ආදායම | 2,648,838 |
| 1,618,465 | මීගමුව රෝහල පොම්පාගාර නඩත්තු ආදායම | 1,882,394 |
| 1,971,029 | ගම්පහ රෝහල පොම්පාගාර නඩත්තු ආදායම | 2,740,297 |
| 776,322 | ගම්පහ ඇල්විටිගල නිවාස යෝජනා ක්‍රමය නඩත්තු ආදායම | 776,323 |
| 14,357 | හිල්ඩා මහල් එෆ් ගොඩනැගිල්ලේ අළුත්වැඩියා | - |
| 7,038,210 | | 8,047,852 |

| | විවිධ ආදායම් | උපලේඛණ 12 |
|---|---|---|
| 353,940 | කතරගම සංචාරක බංගලා ආදායම | 414,800 |
| 117,685 | වෙනත් ආදායම් | 61,707 |
| 147,225 | රක්ෂණ වන්දි | 383,393 |
| 59,906 | වාහන කුලී ආදායම | - |
| 678,756 | | 859,900 |

| | ලියාපදිංචි ගාස්තු | උපලේඛණ 13 |
|---|---|---|
| 24,000 | කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි ආදායම | 25,000 |
| 123,000 | පුද්ගලික කළමනාකරණ සංස්ථා ලියාපදිංචි ආදායම | 100,500 |
| 276,850 | පුද්ගලික කළමනාකරණ සංස්ථා ලියාපදිංචිය අළුත්කිරීමේ ආදායම | 718750 |
| 32,000 | රජයේ නිවාස ක්‍රමවල කළමනාකරණ සංස්ථා ලියාපදංචි ආදායම | 19,500 |
| 25,250 | රජයේ නිවාස ක්‍රමවල කළමනාකරණ සංස්ථා ලියාපදිංචිය අළුත්කිරීමේ ආදායම | 52,500 |
| 410 | සුනාමි නිවාස ක්‍රමවල කළමනාකරණ සංස්ථා ලියාපදිංචිය අළුත්කිරීමේ ආදායම | 1,500 |
| 15,750 | පුද්ගලික කළමනාකරණ කමිටු ලියාපදිංචි ආදායම | 3,500 |
| 28,850 | පුද්ගලික කළමනාකරණ කමිටු ලියාපදිංචිය අළුත්කිරීමේ ආදායම | 43,250 |
| 1,250 | රජයේ නිවාස ක්‍රමවල කළමනාකරණ කමිටු ලියාපදිංචි ආදායම | 1,750 |
| 1,750 | රජයේ නිවාස ක්‍රමවල කළමනාකරණ කමිටු ලියාපදිංචිය අළුත්කිරීමේ ආදායම | 1,500 |
| 1,000 | සුනාමි නිවාස ක්‍රමවල කළමනාකරණ කමිටු ලියාපදිංචි ආදායම | 1,200 |
| 129,500 | සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීමේ ආදායම | 110,000 |
| 759,610 | | 1.078,950 |

| | අලුත්වැඩියා සහ නඩත්තු වියදම් | උපලේඛණ 14 |
|---|---|---|
| 18,718 | ගම්පහ ඇල්විටිගල නිවාස ක්‍රමයේ අලුත්වැඩියා හා නඩත්තු වියදම් | 40,715 |
| 215,666 | මීගමුව රෝහල පොම්පාගාර නඩත්තු වියදම් | 362,391 |
| 231,637 | මාදිවෙල පාර්ලිමේන්තු නිවාස ක්‍රමය නඩත්තු වියදම් | 387,116 |
| 5,700 | ගම්පහ රෝහල පොම්පාගාර නඩත්තු වියදම් | 70,482 |
| _ | ජල්තර නිවාස ක්‍රමයේ නඩත්තු වියදම | _ |
| 9,957 | හිල්ඩා මහල් එෆ් ගොඩනැගිල්ලේ අළුත්වැඩියා වියදම් | _ |
| 481,678 | | 860,704 |

| | නගමු පුරවර අත්තිකාරම් | උපලේඛණ 15 |
|---|---|---|
| 2,491,071 | නගමු පුරවර ව්‍යාපෘතිය සඳහා ලද මුදල් | 2,491,071 |
| 1,346,342 | අඩු කලා - වැඩ වටිනාකම | (1,346,342) |
| 1,144,729 | 2011/12/31 දිනට ඉතිරි | 1,144,729 |

| | ව්‍යපෘති සේවා ගාස්තුව | උපලේඛණ 16 |
|---|---|---|
| 1,196,884 | පදිංචියට නුසුදුසු තත්වයේ සහාධිපත්‍ය දේපල නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති වාර්ථා සකස් කිරීම | |
| 3,531,175 | රජය ඉදිකල ජාතික නිවාස ක්‍රමයන්හි අත්‍යවශ්‍ය හා හදිසි අලුත්වැඩියා | 7,338,353 |
| 315,782 | සහාධිපත්‍ය දේපල පදිංචිකරුවන් හා ක්ෂේත්‍රයට අදාල පුද්ගලයින් දැනුවත් කිරීමේ වැඩසටහන | |
| | වෙනත් ව්‍යාපෘති | 291,219 |
| 5,043,841 | | 7,629,572 |

| | භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් ඉටුකරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘති | | උපලේඛණ 17 |
|---|---|---|---|
| 42,000,000 | භාණ්ඩාගාර ප්‍රතිපාදන | | 55,500,000 |
| | <u>අඩු කලා ව්‍යාපෘති වියදම්</u> | | |
| 15,000,000 | (1) පදිංචියට නුසුදුසු සහාධිපත්‍ය දේපල නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති වාර්ථා සකස් කිරීම | | 48,161,647 |
| | අධිකාරියේ සේවා ගාස්තුව | | |
| 25,000,000 | (2) සර්පන්ටයින් ජාතික නිවාස ක්‍රමයේ අත්‍යවශ්‍ය හා හදිසි අළුත්වැඩියා | | |
| | අධිකාරියේ සේවා ගාස්තුව | | |
| 2,000,000 | (3) සහාධිපත්‍ය දේපලවල පදිංචිකරුවන් හා ක්ෂේත්‍රයට අදාල පුද්ගලයින් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහාධිපත්‍ය පුවත්පත | | |
| | අධිකාරියේ සේවා ගාස්තුව | උපලේඛණ 16 | 7,338,353 |
| 17,000,000 | එකතුව | | 55,500,000 |

# සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

## 2012/12/31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහය | | 16,005,451 |
| ආදායම් බදු සහ විශේෂිත වූ අයිතම වලට පෙර ශුද්ධ අලාභය | | |
| ගැලපුම් | | |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලාභය | | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන - වැටුප් සඳහා | (7,047,495) | |
| ක්ෂය වෙන්කිරීම් | (39,050,000) | |
| ආයෝජන ආදායම් | 3,537,805 | |
| පොලී වියදම | (1,238,715) | (43,798,405) |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය) | | (27,792,954) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්** | | |
| තොග වැඩිවීම | (73,708) | |
| ණයගැති අඩුවීම | 1,059,377 | |
| වෙනත් ලැබිය යුතු ශේෂ වැඩිවීම | (672,654) | |
| කල් බදු ණය වැඩිවීම | (20,650) | |
| ගෙවිය යුතු ශේෂ වැඩිවීම | 12,350,893 | |
| උපචිත වියදම් වැඩිවීම | 16,799,130 | |
| ණය හිමියෝ වැඩිවීම | 3,608 | |
| ප්‍රතිපාදන අඩුවීම | 1,229,707 | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ජනිත වන මුදල් ප්‍රවාහය | (1,100,168) | 29,575,535 |
| කල් බදු වාරික ගෙවීම | | 1,782,581 |
| පොලී ගෙවීම් - කල්බදු | | 2,365,790 |
| ආදායම් බදු ගෙවීම | | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ශුද්ධ ලාභය | | 41,148,371 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම - වැටුප් සඳහා | | 39,050,000 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම - ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා | | 55,500,000 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම - ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ගෙවීම් | | (55,500,000) |
| | | 43,198,371 |
| **ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය** | | |
| ආයෝජන | (33,845,320) | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (20,684,600) | |
| ස්ථාවර වත්කම් විකිණීම | 7,072,495 | |
| පොලී ලැබීම් | 1,298,715 | |
| ලාභාංශ ලැබීම් | | (46,218,710) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදවන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 3,020,339 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය** | | |
| දිගු කාලීන ණය ලැබීම් | | |
| මූල්‍ය කල් බදු පහසුකම් සඳහා ගෙවීම | (2,365,790) | |
| ලාභාංශ ගෙවීම් | | |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදවන මුදල් | | (2,365,790) |
| මුදල් හා මුදල් සමාන දෑ සඳහා ශුද්ධ මුදල් ප්‍රවාහය | | (5,386,129) |
| ආරම්භක ශේෂය - මුදල් සමාන දෑ | | 7,015,002 |
| අවසාන ශේෂය - මුදල් හා සමාන මුදල් සමාන දෑ | | 1,628,873 |

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ
2005 වසරේ සිට 2011 දක්වා ආදායම් වියදම් විස්තරය (රු.)

| | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|
| ආදායම | 35,404 | 72,351 | 66,813 | 38,630 | 57,823 | 44,686 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | | | | | | |
| වැටුප් සඳහා | – | – | 34,000 | – | – | – |
| ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා | – | – | – | – | – | 42,000 |
| | 35,404 | 72,351 | 100,813 | 38,630 | 57,823 | 86,686 |
| වැටුප් හා දීමනා | 56,140 | 68,151 | 70,776 | 38,287 | 38,176 | 43,264 |
| අනෙකුත් ක්‍රියාකාරී වියදම් වියදම් | 11,722 | 14,025 | 23,467 | 17,111 | 19,605 | 19,749 |
| ප්‍රාග්ධන ව්‍යාපෘති වියදම් | 542 | 9,091 | – | – | – | 42,625 |
| | 68,404 | 91,267 | 94,243 | 55,398 | 57,781 | 105,637 |
| ලාභය / (අලාභය ) | (33,000) | (18,916) | 6,570 | (16,768) | 42 | (18,952) |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No: ඊඑච්/ඩී/සීඑම්ඒ/ 2012 /එල්ඒ | ඔබේ අංකය<br>உமது இல<br>Your No: | දිනය<br>திகதி<br>Date: 2013 ඔක්තෝබර් |

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ... 11 NOV 2013 ... Condominium Management ...

සභාපති,
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය.

<u>සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති

පිටපත -
1. ලේකම්, ඉදිකිරීම්,ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail: oaggov@sltn

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

# විගණකාධිපති වාර්තාව 2012

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය□ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1973 අංක 10 දරන පොදු පහසුකම් මණ්ඩල පනතේ 21 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ මුදල් පනතේ 13(7) (ඒ) වගන්ති ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2013 මැයි 27 දින නිකුත් කරන ලදී

## 1.2 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ,

## 1.3 විගණන විෂය පථය

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරා ගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ. මාගේ තත්වාගණනය කල විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්වාගණනය කල විගණන මතය සඳහා පදනම

| | |
|---|---|
| මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ. | |

## 2. මූල්‍ය ප්‍රකාශණ

### 2.1 තත්වාගණනය කළ මතය

| | |
|---|---|
| මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. | |

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

| පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය | |
|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයට අදාල අධිකාරියේ ශුද්ධ අතිරික්තය වූ රු.16,005,452 ක් වෙනුවෙන් රු.5,601,908 ක් වූ ආදායම් බදු ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | (අ) 2012 වර්ෂයේදී අධිකාරිය රු.මිලියන 23.04 ක මෙහෙයුම් අලාභයක් ලබා ඇති අතර වැටුප් ගෙවීම සඳහා 2012 වර්ෂයේ දී රු.මිලියන 39.05 ක් භාණ්ඩාගාරයෙන් ලබාදී ඇත. මෙම තත්වය තුල 2012 වර්ෂයේදී වැටුප් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීම නිසා රු.මි.16.0 ක ශුද්ධ අතිරික්තයක් පෙන්නුම් කලද මෙහෙයුම් අතිරිතයක් නැති ඉදිරි වර්ෂවලදී මෙම තත්වය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. |
| (ආ) සමාලෝචිත වසර අවසානයට රු.මිලියන 23.31 ක් වූ කෙරී ගෙන යන කොන්ත්‍රාත්, කෙරී ගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | (ආ) සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 55.5 ක් පැරණි නිවාස ක්‍රම අළුත්වැඩියා සඳහා ලැබී ඇති අතර එම සියළු මුදල් යොදවා ඉටු කරන ලද වැඩ වටිනාකම ගිණුම් වලට ගලපා ඇත. |
| (ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධනය වෙනස්වීම ගණනය කිරීමේදී, ශේෂ පත්‍රයේ ජංගම වගකීමක් ලෙස දක්වා ඇති රු.මිලියන 2.79 ක් වන ලංකා බැංකු කල්බදු ණය මුදල, කාරක ප්‍රාග්ධන වෙනස්වීම ගණනය කිරීම තුල ඇතුළත් කර නොතිබුණි. | (ඇ) සංශෝධිත මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය මේ සමඟ ඉදිරිපත් කරමි. |
| (ඈ) ගිණුම් පිළිබඳ සටහන් අංක 7 ට අනුව බොල් හා අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය පසුගිය වර්ෂයේදී වෙනස් කර තිබූ අතර, රු.7,054,617 ක් වූ අවුරුදු 1-4 දක්වා කාල පරිච්ජේදයට අයත් වූ ණයගැතියන් සඳහා රු.211,639 ක් ප්‍රතිපාදන සලකා නොතිබුණි. | (ඈ) මීට පෙර බොල් සහ අඩමාන ණය වෙන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණය සහ විගණන වාර්තාවේ පෙන්නා දී ඇති කරුණු නැවත අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට කටයුතු කරනු ඇත. |

| | |
|---|---|
| **2.2.2 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම** | |
| අධිකාරියේ ශුද්ධ වත්කම් සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ තුනක පිළිවෙලින් රු.15,788,833 රු.31,794,284, රු.12,841,863 සහ රු.12,869,156 ක් වශයෙන් සෘණ අගයක් ගන්නා අතර සේවක වැටුප් ගෙවීම වෙනුවෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම් නිසා පසුගිය වසරට සාපේක්ෂව ශුද්ධ වත්කම් 50.3% කින් වැඩිවුවද, ජංගම අනුපාතය පිළිවෙලින් 1:1.5, 1:2.1, 1:1.9 හා 1:2.8 ක් වන බැවින් භාණ්ඩාගාරයේ මූල්‍ය සහායක් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණත් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම ප්‍රශ්නකාරී වේ. | පසුගිය වසරට සාපේක්ෂව ශුද්ධ වත්කම් පිරිහීම කෙරෙහි බලපාන ලද ප්‍රධාන හේතූන් වනුයේ ගෙවිය යුතු වගකීම් රු.මිලියන 16.8 කින් සහ කල්බදු ණය රු.මිලියන 2.7 කින් වැඩිවීම නිසා ජංගම වගකීම් ශේෂය ඉහල ගොස් තිබීම හේතුවෙනි. එසේ වැඩිවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ 2012/12/31 දිනට ගෙවිය යුතු කොන්ත්‍රාත් කරුවන්ගේ ගෙවීම් රු.මිලියන 11.00 කින් ද රඳවාගත් මුදල් රු.මිලියන 3.0 ක් සහ ආරක්ෂක තැන්පතු රු.මිලියන 1.3 කින් වැඩිවීම වේ.<br>එහෙත් මෙම වටිනාකම් 2013 මුල් කාර්තුව තුල 75% ක් පමණ ගෙවා අවසන්ව ඇත.<br>එමෙන්ම මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ණය නිරවුල් කිරීම ප්‍රමාදවීම සහ පොත්වලින් කපාහැරීම නියමිත ණයගැති ශේෂ පොත්වලින් කපාහැරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාදීම ප්‍රමාද වීමද හේතුවී ඇත. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරී පනත සංශෝධනය කිරීම සඳහා දැනට කටයුතු කරමින් පවතින අතර එම සංශෝධන ක්‍රියාත්මක කිරීම තුලින් ආදායම් තත්වය ඉහළ නංවා ගැනීම සඳහා අපේක්ෂා කරනු ලබයි. 2013 වර්ෂයේදී ද මෙම තත්වය පවත්නා බැවින් එම තත්වය මගහරවා ගැනීම සඳහා අධිකාරියේ සේවක වැටුප් ගෙවීමට රු.මිලියන 10 ක් භාණ්ඩාගාරය විසින් ලබා දී ඇත. |
| **2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්** | |
| පහත නිරීක්ෂණයන් කරනු ලැබේ | |
| (අ) වසර 05 කට වැඩි කලක සිට ඉදිරියට ගෙන එන ලද සේවා දායක ණයගැතියන් 04 දෙනෙකුගෙන් ලැබිය යුතු ශේෂ වල එකතුව රු 2,979,472 ක් වූ අතර එම ණය අයකර ගැනීමට අධිකාරිය විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | (අ) වසර 5ට වැඩි ණය ගැතියන් 04 දෙනාගෙන් රු.2,979,472/- ක මුදල පොත් වලින් කපා හැරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යංශයේ ලේකම් වෙත බලය පවරා ඇති අතර ඒ අනුව අමාත්‍යාංශ ලේකම් විසින් පොත්වලින් කපාහැරීම සඳහා අනුමැතිය ලබාදී ඇත. |
| (ආ) වසර 05 කට වැඩි කලක සිට ඉදිරියට ගෙනෙන ලද සේවාදායකයන්ගෙන් ලබා ගත් අත්තිකාරම් රු 104,453 ක් හා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යංශය වෙත ගෙවිය යුතු රු 9,125,215 ක්, විවිධ අත්තිකාරම් රු. 223,014 ක් සහ භාණ්ඩ හා සේවා බදු රු 15,733,971 නිරවුල් කිරීම සමාලෝචන වර්ෂය අවසානය වන විටත් අධිකාරිය විසින් පියවර ගෙන නො තිබුණි. | (ආ) අධිකාරියේ පවත්නා මූල්‍ය තත්වය හේතුවෙන් ණය හිමි ශේෂ නිරවුල් කිරීම ප්‍රමාද කිරීමට සිදුවී ඇති අතර තවදුරටත් කාලය ලබා ගත යුතුව ඇත.<br>ගෙවිය යුතු භාණ්ඩ හා සේවා බදු මුදල නිරවුල් කර ගැනීම සඳහා ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර ප්‍රවර්තන වර්ෂයේදී නිරවුල් කල හැකි වේ යැයි අපේක්ෂා කෙරේ. |
| (ඇ) µÁÂ &ù$ö æÎÈ <Ùð àù< Ø`.177,000 æ ó × {Æ µÁÂ×æ µ<ùµ<ù {$ äæõ< Ø`.31,046 æ ó × è`õ×ù 03 µ÷µùæµè µÁÂ×ù µ<ùµ<ù å<ù Ñ&ù äæê Ò µù$õý ó . | (ඇ) ණයහිමියන් දෙදෙනා සම්බන්ධ විස්තර පහත ඉදිරිපත් කරමි. |

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වාර්ෂික වාර්තාව 2012

| | |
|---|---|
| ෆැන් ආච් (පුද්) සමාගම | |
| ගිවිසුම අනුව ගෙවිය යුතු මුදල | රු.3,500,000.00 |
| අඩුකලා : | |
| 2012/09/26 ගෙවීම් | රු1,050,000.00 |
| 2012/12/31 දිනට පවත්නා ශේෂය (ලෙජර් ගිණුම් අනුව) | රු2,450,000.00 |

| | |
|---|---|
| නීතිපති දෙපාර්තමේන්තුව | |
| 2012/06/30 ජේ/ඊ 123 අනුව ගිණුම් ගත කරන ලද වටිනා-කම | රු. 1,024,800.00 |
| ගෙවීම් : | |
| 2012/12/31 දිනට ශේෂය (ලෙජර් ගිණුම් අනුව) | රු. 1,024,800.00 |

ඒ අනුව 2012/12/31 දිනට ගිණුම් අනුව පවත්නා ශේෂය නිවැරදි ශේෂය බවට වාර්තා කරමි

(ඇ) එකඟතාවක් නොදක්වන ලද පහත සඳහන් ණය ගැතියන් සම්බන්ධ විස්තර පහත ඉදිරිපත් කරමි

| | |
|---|---|
| සමතකරණ ණයගැතියන් | |
| හැටන් නැෂනල් බැංකු (එච්.එන්.බී.ටවර්) | රු. 3,427.00 |
| අඩුකලා : | |
| 2000 ප්ලාසා පුද්ගලික සමාගම | රු.20,764.80 |
| ලිබර්ටිප්ලාසා (ඒ.එම්.ජයන්ත ) | රු. 6,854.40 |

මෙම වටිනාකම සමථකරණය සඳහා ලැබිය යුතු අතර එම මුදල් ලෙජර් ගිණුම අනුව නිවැරදි වේ.

| | |
|---|---|
| මාදිවෙල පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය | |
| 2012 ඔක්තෝම්බර් | රු. 267,828.80 |
| 2012 නොවැම්බර් | රු. 253,351.32 |
| 2012 දෙසැම්බර් | රු. 256,047.88 |
| ලෙජර් ගිණුම් ශේෂය | රු. 777,228.00 |
| ශේෂය තහවුරු කිරීම් අනුව එකඟ වී ඇති වටිනාකම | රු. 778,196.67 |
| වෙනස | රු. 968.67 |

| | | |
|---|---|---|
| | | මෙම වටිනාකම 2012 නොවැම්බර් බිල්පත සංශෝධනය වීමක් හේතුවෙන් සිදු වී ඇත. ඒ අනුව නොවැම්බර් මාසය සඳහා අධිකාරිය යවා ඇති බිල්පත් වටිනාකම රු.253,351.32 ක් ලෙස යවා ඇති නමුත් සංශෝධිත බිල්පත වටිනාකම රු.254,319.99 ක් විය යුතු වේ.<br>මේ අනුව රු.968.67ක වෙනස ජේ/124 මගින් 2013 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන ලදී. |
| **2.2.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම** | | |
| පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය | | |
| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව<br>(අ) ආයතන සංග්‍රහය | අනුකූල නොවීම | |
| i) II පරිච්ඡේදය 13.3 වගන්තිය | පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු නොකර නිලධාරීන් දෙදෙනෙක් මාස 03 සිට මාස 14 දක්වා කාලයක් වෙනුවෙන් අනුමැතියකින් තොරව වැඩ බැලීමට පත් කර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේදී වැටුප ලෙස රු.102,560 ක් ගෙවා තිබුණි. | (අ) අධිකාරියේ මූල්‍ය තත්වය යහපත් වූ විට මෙම තනතුරු සඳහා නව සේවකයන් බඳවා ගන්නාතෙක් ආයතන ප්‍රධානී විසින් සහකාර සමාන්‍යාධිකාරී (මුදල්) තනතුර, සහකාර සමාන්‍යාධිකාරී (මෙහෙයුම් හා නඩත්තු) තනතුරු වැඩ ආවරණය කිරීම සඳහා නිලධාරීන් දෙදෙනකු පත්කරන ලදී. එම නිලධාරීන් මගින් තවදුරටත් එම කාර්යය ඉටුකර ගැනීම සඳහා 2013 ජුනි මස 20 වන දින පැවති 89 වෙනි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. |
| අධිකාරියේ මූල්‍ය තත්වය යහපත් වූ විට මෙම තනතුරු සඳහා නව සේවකයන් බඳවා ගන්නා තෙක් ආයතන ප්‍රධානියා විසින් වැඩ ආවරණය කිරීම සඳහා පත් කරන ලද නිලධාරීන් තවදුරටත් එම කාර්යය ඉටුකිරීම සඳහා දීර්ඝ කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරන බව සාමාන්‍යාධිකාරී විසින් මා වෙත දන්වා ඇත. | | |
| (ii).XIV පරිච්ඡේදයේ 3 හා 4 ඡේද | නිලධාරියෙක් ස්වකීය රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා ගමන් බිමන් යාමේදී ආණ්ඩුවට අවම වියදමක් දැරීමට සිදුවන පරිදි නවාතැන් සහ යැපීම් දීමනා වෙනුවෙන් සංයුක්ත දීමනා ලබාදීම සිදුකල යුතු වුවත්, ඊට පටහැනිව අධිකාරියේ නිලධාරීන් කිහිප දෙනෙකුට හෝටල් බිල් පියවීම සඳහා රු,49,900 ක් ගෙවා තිබුණි. | ii)සංයුක්ත දීමනාව ගෙවීම මත පමණක් නිලධාරීන් මෙවැනි දුෂ්කර පළාත්වල රාජකාරීන් සඳහා අකමැත්ත ප්‍රකාශ කරන අතර, එහිදී අධිකාරිය ප්‍රායෝගික ගැටළුවකට මුහුණ පාන අවස්ථා තිබේ. මෙවැනි අවස්ථාවලදී කල්මුනේ, අම්පාර වැනි දුෂ්කර පළාත්වල සුනාමි සභාධිපත්‍ය දේපල සම්බන්ධ රාජකාරීන් ඉටු කරවා ගැනීමේදී ආහාර සහ නවාතැන් පහසුකම් ලබා දීමට යටත්ව නිලධාරීන් යෙදවීම කිරීමට සිදුවී ඇත.මෙම තත්වය වලක්වා ගත හැකි සෑම අවස්ථාවකදීම එසේ කටයුතු කර ඇති බවද වාර්තා කරමි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍යව්‍යාපාර චක්‍රලේඛය 8.3.4 ඡේදය | නිවාස දුරකථන දීමනා සඳහා හිමිකම් නොමැති මාණ්ඩලික ශ්‍රේණියේනොවන නිලධාරීන් 06 දෙනකුගේ දුරකථන බිල්පත් පියවීම සඳහා අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ රු.42,365ක් වැය කර තිබුණි. | (ආ) මෙම නිලධාරීන්ට ලබාදෙන ලද දුරකථන දීමනාව 2013/06/01 දින සිට නතර කිරීමට කටයුතු කරන ලදී. |

| | | |
|---|---|---|
| (ඇ)මු.රෙ.756(4)හා 2004 අගෝස්තු 31 දිනැති අංක 353 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අපහරණය කිරීමට සුදුසු වාහන හඳුනා ගැනීම සඳහා අමාත්‍යංශ ලේකම් විසින් සුදුසුකම් ලත් තිදෙනකුගෙන් යුතු විශේෂ මණ්ඩලයක් පත් කල යුතු අතර වාහනයේ වටිනාකම්ද එම මණ්ඩලය මගින් තීරණය කල යුතු වුවත්, රු.7,047,495 ක් වටිනා වාහන 04 ක් අපහරණය කිරීමේදී එලෙස කටයුතු කර නොතිබුණි. | (ඇ) අධිකාරිය විසින් මීට පෙර වාහන අපහරණය කිරීමේදී ලංකා ඔටෝ මොබයිල් ආයතනය මගින් තාක්ෂණික වාර්තා ලබා ගෙන ඇති බැවින් ඒ අනුව කටයුතු කරන ලදී එහෙත් මෙම කාර්යය කිරීමේදී සිදුවී ඇති දුර්වලතා ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලබයි. |

## 2.2.5 අධිකාරි බලය ඉක්මවා කටයුතු කිරීම්

| | |
|---|---|
| පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| අධිකාරිය විසින් වාහන මිලදී ගැනීමේ අවශ්‍යතාවයට අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2012 මැයි 17 දිනැති ලිපිය මගින් පෙට්‍රල් කාර් 01 ක් සහ ඩීසල් කැබ් රථ 03 ක් මිල දී ගැනීම සඳහා අනුමැතිය ලබාගෙන තිබුණද, ඊට පටහැනිව පෙට්‍රල් කාර් 03 ක් සහ ඩීසල් කැබ් රථ 01 ක් මිලදී ගෙන තිබුණි. | අයවැයෙන් වෙන්කර ඇති ප්‍රතිපාදන හා ලැබී ඇති ප්‍රතිපාදන හා ලැබී ඇති මිල ගණන් සැසඳීමේ දී කැබ් රථ 03ක් සහ මොටර් කාර් රථයක් මිල දී ගැනීම කල-හොත් අයවැය සීමාව ඉක්මවා යැමක් සිදුවේ. එමෙන්ම මෙම මිලදී ගත් වාහන වලින් කාර් රථ 03 ක් ආයතනයේ නිළධාරීන් සඳහා වෙන් කිරීමටත් එක් කැබ් රථයක් සංචිතය සඳහා මිලදී ගැනීමටත් කටයුතු කර ඇත. මේ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි.<br>තවද භාණ්ඩාගාරයේ රාජ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛන අංක 112 මගින් ලබාදී ඇති එන්ජින් ධාරිතා සීමාවන් සැලකිල්ලට ගන්නා ලදී.එමෙන්ම මිට්සුබිසි වර්ගයේ ලාන්සර් රථ දෙකක් මිලදී ගැනීමේදී ( මෙය ආයතනය සඳහා ලැබු විශේෂ අවස්ථාවකි) එක රථයක් පැරණි මිලට ලබා ගැනීමට හැකිවීම විශේෂ හේතුවක් ලෙස සලකන ලදී. කෙසේ වුවද ඉහත සඳහන් කර ඇති පරිදි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද සංශෝධනවලට භාණ්ඩාගාරයේ අනුමැතියට 2013/08/29 දිනැති ලිපිය මගින් ඉල්ලා ඇත. |

# 3 මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

| | |
|---|---|
| පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ. | |
| ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය රු.16,005,452 ක අතිරික්තයක් වු අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.18,952,422 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.34,957,874 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුල වැටුප් ගෙවීමට ලබා දුන් භාණ්ඩාගාර ප්‍රතිපාදන හා වාහන විකිණීමෙන් ලත් ලාභය , අතිරික්තය වැඩිවීම කෙරෙහි සෘජුව බලපා තිබුණි. | සේවක වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් ප්‍රතිපාදන හා වාහන විකිණීමේ ලාභය ශුද්ධ ලාභ අතිරික්තය කෙරෙහි බලපා ඇත. |

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | |
|---|---|
| (අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් නොවන ආදායම් සියයට 301 කින් වැඩිවී තිබූ අතර සත් දින තැම්පතු පොළී ආදායම වැඩිවීම ඊඑකී ආදායම වැඩි වීමට හේතු වී තිබුණි. | (අ)ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ලැබෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන අදාල ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුවන් සඳහා ගෙවීම් කරන තෙක් සත්දින තැන්පතු ගිණුම් වල තැන්පත් කිරීම මගින් මෙම පොළී ආදායම උපයා ගෙන ඇත. |
| (ආ) අධිකාරියේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන සභාධිපත්‍ය සහතික නිකුත් කිරීම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 22 කින් අඩුවී තිබුණි. | (ආ) අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී අදාල කරගන්නා ලද නාගරික සංවර්ධන අධිකාරිය▫නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය▫ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැනි ආයතන විසින් ඉදිකිරීමට යෝජිතව තිබූ සභාධිපත්‍ය දේපල 2012-12-31 වන තෙක් ඉදිකිරීම් නිමකර නොතිබුනු බැවින් සභාධිපත්‍ය සහතික ලබා ගැනීම සඳහා ඉල්ලුම් නොකිරීම මෙම ආදායම අඩු වීමට හේතු විය. ඉදිකරන ලද සභාධිපත්‍ය දේපල මේ වන තෙක් අනුකූලතා සහතික ලබා නොගැනීම නිසා සභාධිපත්‍ය සහතිකය ලබා ගැනීමට ද කටයුතු කර නැත.<br>මෙම තත්වය තුල අපේක්ෂිත ආදායම ඉපයීමට අපහසු වී ඇත. |
| (ඇ) සමාලෝචිත වසර තුළ යෙද වූ ප්‍රාග්ධනයට මුළු ශුද්ධ වත්කම් අනුපාතය -526 % ක් විය. | (ඇ) ශුද්ධ වත්කම් අනුපාතය මෙසේ පහළ යාමට ප්‍රධාන හේතුන් වී ඇත්තේ 2012/12/31 දිනට ගෙවිය යුතු කොන්ත්‍රාත් ගෙවීම් රු.මිලියන 11.00 කින් ද රඳවාගත් මුදල් රු.මිලියන 3.00 කින්ද ආරක්ෂිත තැන්පතු රු.මිලියන 1.3 කින් ද, වැඩි වී ඇති බැවිනි. |

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ කාර්ය සාධනය, ඉලක්ක සමඟ සසඳා පහත දැක්වේ.

| විෂය | ඉලක්ක ගත කාර්ය සාධනය | | |
|---|---|---|---|
| | ඉලක්ක ගත | සත්‍ය | ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රතිශතය |
| කළමනාකරණ සංස්ථා පිහිටුවීම ලියාපදිංචිය හා අළුත් කිරීම | 250 | 219 | 88 |
| සභාධිපත්‍ය සහතික නිකුත් කිරීම | 116 | 58 | 50 |

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ

| | |
|---|---|
| (අ) ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක හා ඒවා ලඟා කර ගැනීම අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන්, ක්‍රියාකාරී සැලැස්ම අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් ඵලදායීව යොදා ගන්නේද යන්න පිළිබඳව අවිනිශ්චිත විය.තවද, සහාධිපත්‍ය නියාමන සමථකරණය හා මෙහෙයුම් කටයුතු ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කයන් ලෙසද දක්වා නොතිබුණි. | (අ) කළමනාකරණ සංස්ථා පිහිටුවීම 250 ක් ලෙස ඇස්තමේන්තු කිරීමේදී සුනාමි ව්‍යසනයේදී ඉදි කරන ලද සහාධිපත්‍ය දේපල ද සැලකිල්ලට ගෙන ඇත.<br><br>එහෙත් එම වර්ෂය තුලදී එම දේපල වල සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමට ඉඩම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයට නොහැකි වීම නිසා මෙම දේපල වල කළමනාකරණ සංස්ථා පිහිටුවීමට ද නොහැකි විය. මෙය කාර්ය සාධනය අඩුවීම කෙරෙහි බලපා ඇත.<br><br>කෙසේ වෙතත් මීට පෙර වර්ෂ හා සසඳා බැලීමේදී කළමනාකරණ සංස්ථා පිහිටුවීම සම්බන්ධ ඉහළ කාර්ය සාධනයක් වාර්තා කර ඇත.<br>සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම සඳහා ඉලක්ක නියම කිරීමේදී 2011 දී ආරම්භ කරන ලද නාගරික පුනර්ජීවන වැඩ සටහන යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීමට නියමිත නිවාස ව්‍යාපෘති 17 ක් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ඉදිකිරීමට නියමිත ව්‍යාපෘති 5 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඉදිකිරීම් කරන ලද නිවාස ව්‍යාපෘතීන් 5ක් සහ පුද්ගලික අංශයේ දේපල 70 කට අධික සංඛ්‍යාවක් 2012 වර්ෂයේදී තාවකාලික සහාධිපත්‍ය සහතිකය හෝ අර්ධ සහාධිපත්‍ය සහතිකය හෝ පූර්ණ සහධිපත්‍ය සහතිකය ඉල්ලුම් කරාවි යන්න අපේක්ෂා කරන ලදී.<br><br>එහෙත් මෙම අධිකාරියට පාලනය කල නොහැකි විවිධ හේතූන් මත ඉහත ඉදිකිරීම් සඳහා සහතික ලබා ගැනීමට ඉදිරිපත් නොවීම නිසා ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට බලපාන ලදී.<br><br>ඉලක්කයන් සමාලෝචනය කිරීම සඳහා මාණ්ඩලික රැස්වීම් කාර්මික නිලධාරී රැස්වීම් නිතිපතා පවත්වමින් කාර්ය සාධනය ඇගයීමේ පිළිවෙතක් අධිකාරිය විසින් අනුගමනය කරන ලදී එමෙන්ම සෑම මාස තුනකට වරක් විගණන හා කළමනාකරණ රැස්වීමේදී හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ද මෙම කාර්යයන් සම්බන්ධ ඇගයීමක් කරනු ලබයි. එහෙත් අධිකාරියේ මූල්‍ය තත්වය සහ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑවේ කාර්ය සාධනය සම්බන්ධ කළමනාකාරීත්වයේ නිසි අවධානය යොමු නොකිරීම නොව, සහාධිපත්‍ය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තිබූ ඉහතින් සඳහන් කරන ලද අයහපත් තත්වය වේ. තවද සමතකරණය නොහොත් ආරවුල් නිරවුල් කිරීමේදී, ආරවුල් සම්බන්ධයෙන් ඉලක්ක පුරෝකථනය කිරීම කල නොහැක. |
| (ආ) කොළඹ නගරය තුල හා කොළඹ නගරයෙන් පිටත 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ කළමනාකරණ සංස්ථා 659 ක් පිහිටුවා තිබුණ අතර එයින් 295 ක් සමාලෝචිත වසර අවසානය වන විට අක්‍රීය තත්වයේ පැවතුණි එම කළමනාකරණ සංස්ථා නැවත පිහිටුවීමට ද අධිකාරිය පියවර ගෙන නොතිබුණි. | (ආ) අක්‍රීය කළමනාකරණ සංස්ථා සම්බන්ධ වාර්තා 2013 ප්‍රථම කාර්තුව තුලදී ලබා ගත් අතර ඒවැනි අක්‍රිය කළමනාකරණ සංස්ථා 53 ක් 2013 මැයි මාසය වන විට නැවත පිහිටුවීමට කටයුතු සිදුකර ඇත. මෙම අවස්ථාව වන විටත් මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වෙමින් පවතී. |

| | |
|---|---|
| (ඇ) කොළඹින් බැහැර දිස්ත්‍රික්ක වල පිහිටුවිය යුතු කළමනාකරණ සංස්ථා හඳුනා ගෙන නොතිබු අතර සමාලෝචිත වසර අවසාන වන විට ගම්පහ දිස්ත්‍රික්කයේ සහ මහනුවර දිස්ත්‍රික්කයේ කළමනාකරණ සංස්ථා 02 ක් පමණක් පිහිටුවා තිබුණි. | (ඇ) කොළඹින් බැහැර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සහාධිපත්‍ය දේපල හඳුනාගැනීම 2013 ප්‍රථම කාර්තුව වන විට අවසන් කර තිබු අතර, ඒවායේ කළමනාකරණ සංස්ථා පිහිටුවීම සඳහා 2013 වර්ෂයේදී සැලසුම් කර ඇති කෙසේ වුවත් කොළඹින් බැහැර ගම්පහ, මහනුවර හැර අනෙකුත් දිස්ත්‍රික්ක වල ඇත්තේ සුනාමි ප්‍රතිසංස්කරණ යටතේ ඉදිකරන ලද සහාධිපත්‍ය දේපල වේ.එම දේපල සඳහා අයිතිය පැවරීමේ කටයුතු මෙතෙක් සිදුවී නොමැති වීම කළමනාකරණ සංස්ථා පිහිටුවීමේ කාර්ය භාරයට බලපා තිබුණි. |
| (ඈ) 2011 සහ 2012 වර්ෂ වලදී ලියාපදිංචි කරන ලද මුළු කළමනාකරණ සංස්ථා ගණන 365 ක් වුවද එයින් 216 ක් සමාලෝචිත වසර අවසාන වන විටත් ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තු අධිකාරිය වෙත ගෙවා නොතිබුණි. | (ඈ) ලියාපදිංචිය අළුත් කිරීමේදී රාජ්‍ය අංශයේ බොහෝ කළමනාකරණ සංස්ථා ලියාපදිංචිය අළුත් කිරීම සඳහා මැලිකමක් දක්වයි. මෙම තත්වය මඟ හරවා ගැනීම සඳහා අධිකාරිය විසින් විවිධ ක්‍රම මඟින් දැනුවත් කිරීම් කටයුතු කරමින් පවතී . තවද දැනට පවතින පනත මගින් කළමණාකරන සංස්ථා ලියාපදිංචි කිරීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණ ද, යෝජිත සංශෝධිත පනත මගින් ප්‍රතිපාදන සලසා ගැනීමට අපේක්ෂා කරයි. |
| **4.1.2 අරමුණු ඉටු නොවීම** | |
| අධිකාරිය සංස්ථාගත කිරීමේ අරමුණු අතරින් පහත සඳහන් අරමුණු 2013 සැප්තැම්බර් 30 දින වන විටත් ඉටු කරගෙන නොතිබුණි. | |
| (අ) 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතේ 5 (ඉ) වගන්තිය ප්‍රකාරව, සහාධිපත්‍ය කළමනාකරණ සංස්ථාව පිහිටුවීමෙන් පසුව එහි කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම කලයුතු වුවද, අධිකාරිය ලබාදී තිබුණු තොරතුරු අනුව 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නිකුත් කරන ලද සහාධිපත්‍ය සහතික ප්‍රමාණය 611ක් විය.එසේම එම කාල පරිච්ඡේදය තුල ලියාපදිංචි කිරීමට ඉලක්ක කරන ලද කළමනාකරණ සංස්ථා ගණන 1110 ක් වුවද, කළමනාකරණ සංස්ථා 659 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. | (අ) නිකුත් කරන ලද 611 ක් වූ සහාධිපත්‍ය සහතික අතරින් 316 ක් එනම් 50% කට වැඩි ප්‍රමාණයක් ඒකක 5 ට අඩු සහාධිපත්‍ය දේපළ වේ බොහෝ විට එවැනි දේපල පවුලේ අය අතර බෙදී ගොස් ඇති නිසා හා පොදු අංගෝපාංග හා පොදු පහසුකම් විශාල ප්‍රමාණයක් අඩංගු නොවන බැවින් ඒවායේ කළමනාකරණ සංස්ථා පිහිටුවීම සඳහා දේපලේ අයිතිකරුවන් උනන්දුවක් නොදක්වයි. |

| | |
|---|---|
| (ආ) උක්ත පනතේ 5 (උ) වගන්තිය ප්‍රකාරව සහාධිපත්‍ය දේපලේ පොදු පහසුකම් නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත දේපල පැවරීමටද කටයුතු කර නොතිබුණි. | (ආ) පනතේ (උ) වගන්තිය අනුව අයිතිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා මාර්ග ප්‍රවේශයන්, වතු, උද්‍යාන ක්‍රීඩාංගන සහ වෙනත් එළිමහන් ස්ථාන නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත පැවරීම අධිකාරියේ අරමුණු වලින් එකකි.<br>ඉහත සඳහන් පහසුකම් ඇති නිවාස සංකීර්ණ ඇත්තේ ස්වල්පයක් පමණි එයින් මැනිංටවුන් නිවාස ක්‍රමය, සොයිසාපුර නිවාස ක්‍රමය, ඇන්ඩර්සන් යන නිවාස ක්‍රම වල මාර්ග ප්‍රවේශයන් පළාත් පාලන ආයතන වලට පවරා ඇත.<br>මාලිගාවත්ත මහල් නිවාස සංකීර්ණයේ ප්‍රතිසංස්කරණ වලින් පසු මාර්ග ප්‍රවේශයන්, උද්‍යාන, ක්‍රීඩාංගන අයිතය පැවරීම සඳහා කොළඹ මහ නගර සභාව සමඟ සාකච්ඡා ගණනාවක් පවත්වා ඇති අතර ප්‍රතිපාදන නොමැති බැවින් ඒවා පවරා ගැනීම ප්‍රතික්ෂේප කර ඇත.<br>හෝමාගම, ජල්තර රජයේ සේවක නිවාස ක්‍රමයේ මෙවැනි පහසුකම් නඩත්තු කිරීම සඳහා හෝමාගම ප්‍රාදේශීය සභාව සමඟ කරන ලද සාකච්ඡා මෙතෙක් සාර්ථක වී නොමැත. කෙසේ වුවත් රේඛීය අමාත්‍යාංශය මඟින් අදාල පළාත් පාලන ආයතන සමග සාකච්ඡා කිරීමට කටයුතු කරමින් පවතී. |
| **4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා** | |
| පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ | |
| (අ) අධිකාරිය විසින් සිය අරමුණු වලට පරිභාහිරව ගම්පහ හා මීගමුව රෝහල් වල ජල හා මළප්‍රවාහන පද්ධති ක්‍රියා කරවීමේ කටයුතු සිදු කළද, ඒ වෙනුවෙන් විධිමත් ගිවිසුම් වලට එළඹ නොතිබුණි. සමාලෝචිත වසර අවසානයට ගම්පහ රෝහලෙන් අයවිය යුතු වටිනාකම රු.920,322 ක් විය. | (අ) ගම්පහ සහ මීගමුව රෝහල් වල ජල හා මළ ප්‍රවාහන පද්ධති ක්‍රියා කරවීම සම්බන්ධ ගිවිසුම විධිමත් කිරීම සඳහා මේ වන විට කටයුතු කර ඇත.<br>එමෙන්ම මෙම රෝහලෙන් ලැබිය යුතුව තිබූ රු.920,322/- ක මුදලින් රු,188,511.19 ක් මේ වන විට ලැබී ඇති අතර, ඉතිරි මුදල් ගෙවීම සඳහා රෝහල විසින් දැනට කටයුතු කරමින් පවතී. |
| (ආ) කොළඹ 04, බම්බලපිටිය ජාතික නිවාස ක්‍රමය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති වාර්තාව සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා අධිකාරියේ අභ්‍යන්තර ඉංජිනේරු අංශයක් තිබියදී බාහිර පාර්ශවයකට රු.3,500,000 ක මුදලකට පවරා තිබුණි. | (ආ) පවත්නා නිවාස ක්‍රමය නැවත සංවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කිරීම මෙම ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වන අතර එම කාර්ය ප්‍රධාන වශයෙන් ගෘහ නිර්මාණ ශිල්පියෙකුගේ කාර්යන් වේ. මෙවැනි ගෘහ නිර්මාණ ශිල්පීන් මෙම අධිකාරියේ කාර්ය මණ්ඩලයේ නොමැත. එමෙන්ම අධිකාරියේ එම අවස්ථාවේදී පැවති මූල්‍ය තත්වයන් හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ගිවිසුමට අනුකූලව ගෙවීම් කිරීමට නොහැකි වීම නිසා කාලය දීර්ඝ කිරීමට සිදුවිය.<br>ඒ අනුව මෙම කාර්යයන් අවශ්‍ය අවස්ථාවලදී පමණක් බාහිර ආයතනයකින් ලබා ගැනීම අධිකාරිය විසින් කටයුතු කරනු ලබයි. |

| | |
|---|---|
| (i)මෙම කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කිරීම සඳහා සාධාරණ හේතු ඉදිරිපත් කර නොතිබියදී 2012 ඔක්තෝම්බර් 21 දින සිට 2013 පෙබරවාරි 28 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණු නමුත් 2013 මැයි මස දක්වාම එකී වාර්තාව අධිකාරියට ඉදිරිපත් කර නොතිබුණි. | (i) අධිකාරියේ පැවති මූල්‍ය තත්වයන් සැලකිල්ලට ගෙන ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් සිදු කිරීමට නොහැකි විය. එම තත්වය හේතුවෙන් ගිවිසුම් කාලය තුළදී අදාල වාර්තාව ලබාදීමට අපොහොසත් වූ බැවින් නැවත කාලය දීර්ඝ කිරීමට කටයුතු කර ඇත. මේ වන විට සම්පූර්ණ වාර්තාව ලබා ගැනීමට ද කටයුතු කර ඇත. |
| (ii)මෙම කොන්ත්‍රාත්තුව සඳහා සචලීකරණ අත්තිකාරම් ලබා දීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව ලබා දිය හැක්කේ කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක් පමණක් වුවද , ඊට පටහැනිව කොන්ත්‍රාත්කරු වෙත සියයට 30 ක් එනම් රු.1,200,696 ක් සචලීකරණ අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. මේ සඳහා අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ලබා ගෙනද නොතිබුණි. | (ii)මෙම ව්‍යාපෘති වාර්තාව නියමිත කාලයේදී අවසන් කර ගැනීමට අවශ්‍යව තිබූ බැවින් ගෘහ නිර්මාණ ශිල්පි ආයතනය විසින් කර තිබූ ඉල්ලීමට එකගතාවය පල කරන ලදී. |
| (iii)උක්ත කොන්ත්‍රාත්තුව සඳහා තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් පුවත් පත් මගින් ලංසු කැඳවා තිබූ අතර ලංසු භාර ගන්නා අවසාන දිනය 2012 අප්‍රේල් 09 දින ලෙස සඳහන් කර තිබුණද මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් වලට පටහැනිව ලංසු ප්‍රසිද්ධියේ විවෘත නොකර එක් ලංසුවක් 2012 අප්‍රේල් 04 දින විවෘත කර තිබුණි. | (iii)මෙම ටෙන්ඩරය තැපැල් මගින් යොමු කිරීමේදී ලිපි කවරයේ වම් කෙළවරෙහි නිශ්චිත කාර්ය සඳහන් කර නොතිබූ හෙයින් ආයතනයේ තැපැල් අංශය මගින් විවෘත කර දින මුද්‍ර තබා තිබුණි. පසුව එම ලංසුව ටෙන්ඩර් පෙට්ටියට යොමු කර ඉදිරි කටයුතු කරගෙන ගොස් තිබුණි ඒ හේතුවෙන් මෙසේ දින මුද්‍රා දින දෙකක දී සටහන් වීම සිදුවී ඇත.තවද මින් ඉදිරියට එලෙස ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට ක්‍රියා මාර්ග ගනු ලැබේ. |

### 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| | |
|---|---|
| නඩත්තු කාර්යයන් ඉටු කිරීම සඳහා කළමනාකරණ සංස්ථා අරමුදල් ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් රු.6,751,832 ක මුදලක් 2010 ජනවාරි මස 08 දින ලැබුණ ද, 2012 දෙසැම්බර් 31 දින වන විටත් කළමනාකරණ සංස්ථා පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. එම මුදල 2010 වර්ෂයේ ස්ථාවර තැම්පත් ගිණුමක තැන්පත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි ශේෂය රු.7.810,432 ක් විය.<br>ජාතික නිවාස සංවර්ධන අධිකාරියට මේ වන තෙක් මෙම දේපළට අදාල අනුකූලතා සහතිකය ලබා ගැනීමට නොහැකි වී ඇති බැවින් ඔප්පු ලබාදීම සිදුකළ නොහැකිව පවතින බවත් මෙම තත්වය හේතුවෙන් ඒකාබද්ධ කළමනාකරණ සංස්ථා පිහිටුවීම ප්‍රමාද වී ඇති අතර රු.7,810,432 ක් වූ අදාල මුදල අධිකාරිය තුළ තවදුරටත් රඳවා ගැනීමට සිදුව ඇති බවත් සාමාන්‍යාධිකාරි විසින් මා වෙත දන්වා ඇත. | මෙම මුදල කොළඹ 08 පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ඉදිකරන ලද එඩ්මන්ටන් රාජ්‍ය සේවක නිවාස සංකීර්ණයේ කළමනාකරණ සංස්ථාවට අදාල නඩත්තු මුදලකි.මෙම දේපල සඳහා මෙතෙක් අනුකූලතා සහතිකය ලබා ගැනීමට නොහැකිවී ඇති බැවින් නිත්‍යානුකූල කළමනාකරණ සංස්ථාව පිහිටවා නොමැති එබැවින් ජතික නිවාස සංවර්ධන අධිකාරිය භාරයේ තිබූ මෙම මුදල් අධිකාරිය භාරයේ තබා ගැනීම සඳහා 2008 දෙසැම්බර් 24 දින පැවැති 52 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලද අතර ඒ සඳහා එඩ්මන්ටන් නිවාස ක්‍රමයේ කළමනාකරණ කමිටුව විසින් ද ලිඛිතව එකගතාවය පළකර ඇත. |

## 4.4 ආර්ථික නොවූ ගණුදෙනු

සමාලෝචිත වසර තුලදී අධිකාරිය විසින් අපහරණය කල කැබ් රථ 03 ක් සහ කාරයක් වෙන්දේසි කිරීම වෙනුවෙන් වෙළඳපොල තක්සේරු වාර්තා ලබා ගැනීමෙන් පසුව සහ වෙන්දේසි කිරීමට පෙර එම වාහනවල අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.57,787 ක් වැය කර තිබුණි.

අධිකාරියේ වසර 10 කට වඩා පැරණි වාහන 4 ක් අපහරණය කිරීම සඳහා 2011 වර්ෂයේදී තීරණය කරන ලදී.
මෙම වාහන සංචිතයේ එදිනෙදා කටයුතු වලට යොදා ගනිමින් තිබූ වාහන වන අතර එම වාහන අපහරණය කිරීමෙන් පසු නව වාහන මිලදී ගැනීම වහාම කළ යුතුව තිබුණි.
එහෙත් ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම කාර්යය 2012 මැයි මස දක්වා ප්‍රමාද කිරීමට සිදුවිය. ඒ අනුව මෙම වාහන ධාවනය කරමින් තිබූ වාහන වන බැවින් 2012 මැයි මාසයේදී නැවත ඇස්තමේන්තු වාර්තා ලබා ගැනීමට සිදුවූ අතර එම දිනට පසු මෙම වාහන අළුත්වැඩියාව සඳහා වැය වී ඇති මුදල රු.57,787/- ක් පමණි.
මෙම වාහන සේවා අවශ්‍යතා අනුව පාවිච්චි කරමින් තිබියදී විකිණීම සඳහා කටයුතු සිදු කල බැවින් මෙවැනි වියදමක් දැරීමට සිදු විය. තක්සේරු වටිනාකම සහ වෙන්දේසි කිරීමට පෙර එම වාහන සඳහා දරන ලද වියදම යන දෙකෙහි එකතුවට වඩා වැඩි වටිනාකමක් මෙම වාහනය විකිණීම මගින් අධිකාරිය විසින් උපයා ගන්නා ලදී.

## 4.5 කොන්ත්‍රාත් පරිපාලනය

සමාලෝචිත වර්ෂය තුළ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් අළුත්වැඩියා කරන ලද නිවාස ක්‍රම 07 ක් වෙනුවෙන් රු.මිලියන 55.5 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන වර්ෂය තුලදී ලැබී තිබුණි. අධිකාරිය විසින් එම නිවාස ක්‍රම අළුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 65.22 ක් වටිනාකමැති ලංසු 07 ක් කැඳවීම වෙනුවට එම ප්‍රසම්පාදනයේ වටිනාකම උප කොටස් 36 කට වෙන් කර ලංසු කැඳවා තිබුණි. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙනුවට දෙපාර්තුමේන්තු මට්ටමින් ලංසු කැඳවීමක් සිදුකිරීම මෙයින් අපේක්ෂා කර තිබුණු බව විගණනයේදී අනාවරණය විය.

" අදාල කාර්යය නිශ්චිත වර්ෂය තුලදී අවසන් කිරීමට සිදුව තිබීම සහ වඩාත් කාර්යක්ෂමව ඉටුකර ගැනීම අරමුණු කර ගනිමින් මෙසේ උප කොටස් වශයෙන් ටෙන්ඩර් කැඳවන ලද බවත් එසේ ටෙන්ඩර් කැඳවිම මගින් මහා පරිමාණ ටෙන්ඩර් සඳහා ලබා දිය යුතු ප්‍රතිපාදන (පරිපාලන කටයුතු වැනි) මෙම ඇස්තමේන්තු මගින් ඉවත් කර ටෙන්ඩර් කිරීම සඳහා හැකියාව ලැබී ඇති බවත් සාමාන්‍යාධිකාරී විසින් මාවෙත දන්වා ඇත"

අදාල කාර්ය නිශ්චිත වර්ෂය තුලදී අවසන් කිරීමට සිදුව තිබීම සහ වඩාත් කාර්යක්ෂමව ඉටු කර ගැනීම අරමුණු කර ගනිමින් මෙසේ උප කොටස් වශයෙන් ටෙන්ඩර් කැඳවන ලදී.
එමෙන්ම මෙසේ කොටස් කර ටෙන්ඩර් කැඳවීම මගින් මහා පරිමාණ ටෙන්ඩර් සඳහා ලබා දිය යුතු ප්‍රතිපාදන (පරිපාලන කටයුතු වැනි) මෙම ඇස්තමේන්තු මගින් ඉවත් කර ටෙන්ඩර් කිරීම සඳහා හැකියාව ලැබී ඇත.

## 4.6 මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි වේ .

| සේවක වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 15 | 07 | 08 |
| ද්විතීක | 71 | 54 | 17 |
| ප්‍රාථමික | 52 | 49 | 03 |
| | 138 | 110 | 28 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නියාමන) තනතුර සහ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු 07 ක් දීර්ඝ කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවතීම අධිකාරියේ කාර්යය සාධනයට සෘජුවම බලපා තිබුණි.

(අ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නියාමන) සහ සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) යන තනතුරු සඳහා පුවත්පත් මඟින් අයදුම්පත් කැඳවූ නමුත් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති වූ බැවින් බඳවා ගැනීමට නොහැකි විය. සහකාර සමාන්‍යාධිකාරී (මෙහෙයුම්/ නඩත්තු) තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2014 වර්ෂයේදී අයදුම්පත් කැඳවා ඇත. ඉදිරියේදී බඳවා ගැනීමට නියමිතව ඇත.නියෝජ්‍ය සමාන්‍යාධිකාරී නියාමන තනතුර සඳහා අයදුම්පත් කැඳවූ නමුත් නිසි ප්‍රතිචාර ලැබී නොමැති බැවින්, කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවති.

(ආ) තවද ද්වීතීක තනතුරු 17 ක් සහ ප්‍රාථමික තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතියද සමාලෝචිත වර්ෂය තුලදී නිලධාරීන් කිසිවෙකු බඳවා ගෙන නොතිබුණිග

(ආ) ද්විතීක තනතුරු වන ජොෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුරු සඳහා ද ඉහත තත්වය බලපාන ලද බැවින් කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව දන්වා බඳවා ගැනීමේ පටිපාටිය ලිහිල් කරන ලදි. ඒ අනුව 2014 වර්ෂය සඳහා මේ වන විට අයදුම්පත් කැඳවා ඇති අතර බඳවා ගැනීමේ කටයුතු සිදුකරමින් පවති. කෙසේ වුවද ආයතනයේ පවතින මූල්‍ය තත්වයද සලකා කාර්ය සාධනයට බලපෑමක් නොවන පරිදි අත්‍යාවශ්‍ය රාජකාරීන් සඳහා අදාල තනතුරු අභ්‍යන්තර වැඩ බෙදා දීම් මඟින් ආවරණය කර ගන්නා ලදී.

## 4.7 වාහන උපයොජනය

අධිකාරිය සතුව වාහන 08 ක් පවතින අතර එම වාහන සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.2,902,536 ක් ඉන්ධන වියදම සඳහා ද , රු. 3,647,808 ක් අළුත්වැඩියා හා නඩත්තු වියදම් සඳහා ද වැයකර තිබුණු බැවින් කිලෝ මීටරයකට සාමාන්‍ය ධාවන වියදම රු 32 ත් 36 අතර පරාසයක පැවතුනී තවද ඉකුත් වර්ෂයේ කිලෝ මීටරයක සමාන්‍ය ධාවන වියදමට වඩා සමාලොචිත වර්ෂයේ වියදම වැඩිවී තිබුණු බව නිරීක්ෂණය විය.

2012 වර්ෂයේදී පැරණි වාහන සියල්ල ධාවනය සඳහා යොදවා තිබුණ අතර ඒවායේ අළුත්වැඩියා කටයුතු ඉහළ මට්ටමක පැවතිණ.

එමෙන්ම මෙම කරුණට අමතරව ඉන්ධන මිල ඉහළයාම සහ අමතර කොටස් මිල ඉහළ යාම ආදී කරුණු ද මෙම තත්වයට බලපාන ලදී.

මෙම තත්වයට හේතුවූයේ වසර 10 කට වඩා පැරණි වාහන අලුත්වැඩියා කිරීම සඳහා දැරූ වියදමය. 2012 වසර අග භාගයේදී එම වාහන භාවිතයෙන් ඉවත් කර නව වාහන මිලදී ගැනීම මඟින් අලුත්වැඩියාවට දරනු ලබන වියදම අඩුකර ගන්නා ලදී.

| 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය | |
|---|---|
| **5.1** | |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව අධිකාරියේ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී අනුගමනය කළ යුතු පහත සඳහන් නිර්ණායක සැළකිල්ලට භාජනය කර නොතිබුණි.<br>(අ) ඉකුත් වර්ෂ 03 ක මෙහෙයුම් කටයුතු<br>(ආ) වාර්ෂිකව ඉටුකර ගත යුතු කාර්යයන්ගේ ප්‍රමාණය | 2014 වසරේ සිට සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී මෙම නිර්නායක සැලකිල්ලට ගෙන කටයුතු කරන ලදී . |
| **5.2 ක්‍රියාකාරී සැලැස්ම** | |
| ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක හා ඒවා ලඟාකර ගැනීම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. ඉලක්කයන් ඉටුකර ගැනීමේ තත්වයන් කාලීනව සමාලෝචනය කර දුර්වලතාවයන් හඳුනාගෙන ඊට නිසි පිළියම් යෙදීමට කළමනාකරණය නිසි අවධානය යොමුකර නොතිබුණි මෙම තත්වය අධිකාරියේ දුර්වල මූල්‍ය තත්වයට මෙන්ම අඛණ්ඩ පැවැත්ම කෙරෙහිද සෘජුවම බලපා තිබුණි. | ඉලක්කයන් සමාලෝචනය කිරීම සඳහා මාණ්ඩලික රැස්වීම්, කාර්මික නිලධාරී රැස්වීම්, නිතිපතා පවත්වමින් කාර්ය සාධනය ඇගයීමේ පිළිවෙතක් අධිකාරිය විසින් අනුගමනය කරන ලදී එමෙන්ම සෑම මාස තුනකටම වරක් විගණන හා කළමනාකරණ රැස්වීමේදී ද මෙම කාර්යයන් සම්බන්ධ ඇගයීමක් කරනු ලබයි. එහෙත් අධිකාරියේ මූල්‍ය තත්වය සහ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑවේ කාර්ය සාධනය සම්බන්ධ කළමනාකාරිත්වයේ නිසි අවධානය යොමු නොකිරීම නොව සහාධිපත්‍ය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තිබූ අයහපත් තත්වය වේ. |
| **5.3 කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය** | |
| 2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල පනත අනුව කළමනාකරණ මණ්ඩලය නිල බලයෙන් පත් වන සාමාජිකයින් 09 දෙනෙකුගෙන් හා අමාත්‍යවරයා පත් කරනු ලබන තැනැත්තන් 06 දෙනෙකුගෙන් සමන්විත විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේදී කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය අමාත්‍යවරයා පත් කරන නිළධාරීන් දෙදෙනෙකුට පමණක් සීමාවී තිබුණි. | අමාත්‍යවරයා විසින් පත්කල යුතු නියෝජිතයන් වන නිවාස උකස් ණයට දෙන්නන්ගේ සංගමය පෞද්ගලික අංශයේ සංවර්ධකයින්ගේ සංගමය, වැනි ආයතන 2013 දෙසැම්බර් අවසන් වන තෙක් නිසිලෙස ස්ථාපිත වී නොතිබූ බැවින් එම නියෝජිතයින් කළමනාකරණ මණ්ඩලයට පත් කිරීමට නොහැකිවී ඇත.<br><br>කළමනාකරණ සංස්ථා නියෝජනය කිරීම සඳහා නියෝජිතයෙකු අධ්‍යක්ෂක මණ්ඩලයට පත්කර ඇත. |
| **5.4 අයවැය පාලනය** | |
| අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව අයවැය ගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණු බව අනාවරණය විය.<br>මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) ව්‍යාපෘති ඉටුකිරීම වෙනුවෙන් ලබන සේවා ගාස්තු ආදායම අයවැය සමඟ සැසඳීමේදී තථ්‍ය සේවා ගාස්තු සියයට 48.26 කින් පිරිහී තිබුණි. | (අ) 2012 වර්ෂය සඳහා භාණ්ඩාගාරය විසින් ලබාදී තිබූ ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 53.7 ක් එම වර්ෂය තුලදී නොලැබීම හේතුවෙන් මෙම අඩුවීම සිදුවී ඇත. |
| (ආ) සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම් ආදායම අයවැය සමග සැසඳීමේදී තථ්‍ය ආදායම සියයට 65 කින් පිරිහී තිබුණි. | (ආ) අදාල ආයතන 2012 වර්ෂය තුලදී නිම කිරීමට බලාපොරොත්තු වූ සහාධිපත්‍ය ව්‍යාපෘතීන් විවිධ හේතුන් නිසා නිම කිරීමට නොහැකි වීම සහතික ආදායම පහළ වැටීමට විශේෂයෙන් හේතුවිය.<br>මෙම අධිකාරියට පාලනය කල නොහැකි හේතුන් මත සහතික ආදායම මෙසේ පිරිහීමට හේතු විය. |

| | |
|---|---|
| (ඇ) අයවැය ගත වියදම, තථ්‍ය වියදම සමඟ සැසඳීමේදී සියයට 16 සිට 84 දක්වා පරාසයක් තුළ අයවැය ගත වියදමට වඩා තථ්‍ය වියදම අඩුවී තිබුණු අතර, අයවැය ගත වියදම නියමිත පරිදි ඇස්තමේන්තු කර නොතිබුණි. | (ඇ) සියළුම වියදම් පාලනය කිරීම සහ මූල්‍ය තත්වයන් සැලකිල්ලට ගෙන ඇතැම් වියදම් සීමා කිරීම සහ වාහන කල්බදු ගිවිසුම මඟින් ලබා ගැනීම ප්‍රමාද වී වර්ෂය මැද දී සිදුවීම නිසා කල්බදු වාරික ගෙවීම් අඩු වීම ආදී කරුණු මෙම විචලනයන්ට හේතු වී ඇත. |
| **5.5 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම** | |
| අධිකාරිය විසින් 2011 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව සමාලෝචිත වසර අවසාන වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2011 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. |
| **6 පද්ධති හා පාලනයන්** | |
| විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.<br><br>(අ) වාහන උපයෝජනය<br>(ආ) ගිණුම්කරණය<br>(ඇ) සභාධිපත්‍ය දේපළ හඳුනා ගැනිම<br>(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය<br>(ඉ) ණයගැති හා ණයහිමි පාලනය | ඔබගේ නිරීක්ෂණයෙන් සැලකිල්ලට ගෙන අදාල අංශ සම්බන්ධ වැඩි අවධානයක් යොමු කිරීමට සටහන් කර ගන්නා ලදී. |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති